ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මඟ දූතයා

ශුද්ධ බයිබලය

"කුමක් හෙයින්ද, උන්වහන්සේගේ පූර්ණකමෙන් අපි සියල්ලෝම අනුග්‍රහය ලැබීමුව." (යොහාන් 1:16)

84 වන වෙළුම අංක 05 (983) 2025 සැප්තැම්බර් / ඔක්තෝබර්

ඔබේ ශක්තිය ලෙස ක්‍රිස්තුස් වහන්සේ තුළ රැඳී සිටින්න.

"යේසුස් වහන්සේ ඔවුන් ළඟට ඇවිත් කථාකොට, ස්වර්ගයෙහිදී, පොළොවෙහිද, සියලු බලය මට දී තිබේ." (මතෙව් 28:18)

"ඉනින් ස්වාමීන්වහන්සේ තුළ ද උන්වහන්සේගේ ශක්තියේ බලවත්කමෙහි ද බලවත්වෙයල්ලා" (එපීස 6:10)

"උන්වහන්සේ ද, මාගේ කරුණාව නුඹට සෑහේය. මක්නිසාද දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණ වන්නේ යයි මට කී සේක.... " (2 කොරින්ති 12:9)

අවංක කිතුණුවන් අතර ඔවුන්ගේ සම්පූර්ණ දුර්වලතාවය තරම් පොදුවේ පිළිගත් තවත් සත්‍යතාවයක් නොමැත. එමෙන්ම සාමාන්‍යයෙන් වරදවා වටහාගෙන අපයෝජනයට ලක් කරන ලද සත්‍යතාවයක් තවත් නැත. වෙනත් කාරණාවලදී මෙන්ම මෙහිදී ද මනුෂ්‍යයන්ගේ සිතුවිලිවලට වඩා දෙවියන් වහන්සේගේ සිතුවිලි උසස්ව තිබේ. කිතුණුවා බොහෝ විට ඔහුගේ දුර්වලතාවය අමතක කිරීමට උත්සාහ කරයි. දෙවියන් වහන්සේට අවශ්‍ය වන්නේ අපි එය මතක තබාගෙන ගැඹුරින් එය දැනෙන්ට සැලැස්වීමයි. කිතුණුවාට අවශ්‍ය වන්නේ ඔහුගේ දුර්වලතාවය ජයගෙන එයින් නිදහස්වීමටයි. දෙවියන් වහන්සේට අවශ්‍ය වන්නේ අපි එහි නිශ්චලව සිට ඒ තුළ පවා ප්‍රීතිවීමටයි. කිතුණුවා ඔහුගේ දුර්වලතාවයන් ගැන ශෝකවන්නේය. කිතුණුවන් සිතන්නේ තමන්ගේ දුර්වලකම් තම ජීවිතයට සහ දෙවියන් වහන්සේගේ සේවයට මහත් වූ බාධාව බවයි. දෙවියන් වහන්සේ අපට පවසන්නේ එය ශක්තියේ සහ සාර්ථකත්වයේ රහස බවයි. හදවතින්ම පිළිගත් සහ නිරන්තරයෙන් අවබෝධ කරගත් අපගේ දුර්වලතාවය ගැන දුර්වලකමේ දී මාගේ ශක්තිය සම්පූර්ණ වේ යයි පැවසූ උන්වහන්සේගේ ශක්තියට අපගේ ප්‍රවේශවීම සහ අයිතිවාසිකම ලබාදේ.

අපගේ ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ ස්වර්ගීය සිංහාසනයේ අසුන් ගැනීමට ආසන්න වූ විට උන්වහන්සේගේ අවසාන වචන වලින් එකක් වූයේ ස්වර්ගයෙත්, පොළොවෙත් සියලු බලය මට දී තිබේ. දෙවියන් වහන්සේගේ බලයේ දකුණු පැත්තේ අපගේ ස්වාමී වූ යේසුස් වහන්සේ සිංහාසනයේ වාඩිවී සිටීම අලුත් සහ සත්‍ය සිදුවීමක් වූවාක් මෙන්ම මෙම ඇඳුම සියලු බලයෙන් යුක්ත විය. මෙයින් ඉදිරියට මිනිස් ස්වභාවයේ සියලු මාධ්‍යයන් හරහා එහි බලවත් ශක්තීන් ප්‍රකාශ කරන පිණිස දෙවියන් වහන්සේගේ සර්වවාසී ආධිපත්‍ය දැන් මිනිසා වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේට භාර දී ඇත. එබැවින් උන්වහන්සේ ලැබිය යුතු දේ පිළිබඳව මෙම හෙළිදරව්ව සහ උන්වහන්සේගේ ගෝලයන්ට එහි ඇති කොටස පිළිබඳව පොරොන්දුව සමඟ උන්වහන්සේව සම්බන්ධ කරනු ලැබූ සේක. මා ඔසවාගනු ලැබූ විට නුඹලාව ඉහළින් පැමිණෙන බලයෙන් පුරවනු ලබනවා ඇත. (ලූක් 24:49, ක්‍රියා 1:8) ඇදහිලිවන්තයා ජීවිතයට සහ කාර්යයන් ඉටුකිරීම උදෙසා ශක්තිය සොයාගත යුත්තේ සර්වබලධාරී ගැලවුම්කරුවාණන්ගේ බලය තුළය.

ගෝලයන්ට බලය ලැබේ

ගෝලයන්ට එය එසේම සිදු විය. දවස් දහයක් පුරාවට නමස්කාර කරමින් ඔවුන් උන්වහන්සේගේ සිංහාසනය පාමුල බලා සිටියෝය. ඔවුන් උන්වහන්සේ ඔවුන්ගේ ගැලවුම්කරුවාණන් ලෙස උන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් සිටීමත්, උන්වහන්සේ ඔවුන්ගේ ස්වාමියා ලෙස උන්වහන්සේ කෙරෙහි භක්තිය ඇතිව සිටීමටත්. උන්වහන්සේ ඔවුන්ගේ මිතුරා ලෙස උන්වහන්සේ කෙරෙහි ප්‍රේමය ඇතිව සිටීමටත්, උන්වහන්සේ උදෙසා වැඩ කිරීමට ඔවුන්ගේ භක්තිය සහ සූදානම්ව සිටීමත් ප්‍රකාශ කරනු ලැබීය. යේසුස් වහන්සේ ඔවුන්ගේ සිතීමේ, ප්‍රේමයේ, ප්‍රීතියේ එකම වස්තුව වූ සේක. එලෙස නමස්කාර කිරීමේ දී ඔවුන්ගේ ඇදහිල්ලේ සහ භක්තියේත්, ඔවුන්ගේ ආත්ම සිංහාසනය මත උන්වහන්සේ සමඟ දැඩි සහයෝගිතාවයකටත් වර්ධනය වූ අතර ඔවුන් සූදානම් වූ විට බලයේ බෞතිස්මය පැමිණියේය. එම බලය ඔවුන් තුළ සහ ඔවුන් වටා පැතිර ගියෝය.

නොපෙනෙන්නා වූ ඔවුන්ගේ ස්වාමීන්වහන්සේට ජීවිතයෙන් සහ වචනයෙන් සාක්ෂිදීමේ කාර්යයට සුදුසුකම් ලැබීම සඳහා බලය පැමිණියේය. සමහරුන්ට ප්‍රධාන සාක්ෂිය වූයේ ස්වර්ගය සහ එයින් පැමිණෙන ක්‍රිස්තුස් වහන්සේව හෙළිදරව් කරමින් ශුද්ධ වූ ජීවිතයක් ගතකිරීම පිළිබඳ සාක්ෂියයි. ඔවුන් තුළ දේවරාජ්‍යය පිහිටුවීමට, පාපයට හා ආත්මාර්ථකාමීත්වයට එරෙහිව ජයග්‍රහණය ලබාදීමට, සිංහාසනය මත සිටින යේසුස් වහන්සේගේ බලයට සාක්ෂිදීමට, ලෝකයේ මනුෂ්‍යයන්ව ශුද්ධවන්තයන් ලෙස ජීවත්වීමට ජීවමාන අත්දැකීම්වලින් ආදර්ශයක්දීමට ඔවුන් වෙතට බලය පැමිණියේය. අනෙක් අයට යේසුස් වහන්සේගේ නාමයෙන් කථා කිරීමට සම්පූර්ණයෙන්ම යටත් විය යුතුය. එම නිසා සියල්ලන්ට ස්වර්ගයෙන් පැමිණෙන බලයේ දීමනාව අවශ්‍ය විය. එය බලා සිටි සියල්ලන් කෙරෙහි එය පැමිණුනේය. දැන් යේසුස් වහන්සේ පියාණන් වහන්සේගේ රාජ්‍යය ලබාගෙන ඇති බව ඔප්පු කිරීමටත්, ස්වර්ගයේ සහ පොළොවේ සියලු බලය උන්වහන්සේට දී ඇති බව

(ඇන්ඩ්‍රෑ මරේ විසිනි.) (1828 - 1917)

තහවුරු කිරීමටත්, ශුද්ධ වූ ජීවිතයක් ගතකිරීම සඳහා සහ ඵලදායී සේවයක් සඳහා උන්වහන්සේ විසින් උන්වහන්සේගේ සෙනඟට අවශ්‍ය පරිදි එම බලය ලබා දුන් බව ඔප්පු කිරීමටත්. තමන් අයත් යැයි ඔවුන් ප්‍රකාශ කළ දෙවියන් වහන්සේගේ රාජ්‍යය වචනයෙන් නොව බලයෙන් බව ලෝකයට ඔප්පු කිරීමටත්, ඔවුන් ස්වර්ගයෙන් පැමිණි එම බලය ලබා ගත්තෝය. ඔවුන් තුළ ස්වර්ගයෙන් පැමිණි ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය තිබුණු නිසා එය පිටතට සහ ඔවුන් අවට සිටි අය වෙතට ගලා ගියෝය. දෙවියන් වහන්සේගේ බලය එයට යටත් නොවූ අයට පවා දැනුණෝය. (ක්‍රියා 2:43, 4:13, 5:12-13)

අප තුළ ක්‍රිස්තුස් වහන්සේගේ බලය

යේසුස් වහන්සේ මෙම මුල් ගෝලයන්ට කළේ කුමක්ද ? අප තුළත් එලෙසම ක්‍රියාකරන සේක. ඔවුන්ගේ ආරම්භය සහ සහතිකය සෙයාගත් ස්වර්ගයේත්, පොළොවේත්, සියලු බලය මට දී තිබේ. යන වචන වලින් ගෝලයන් ලෙස අපගේ ජීවිතත්, කැඳවීමත් සහතික කර ඇති බව දැනගත යුතුය. උන්වහන්සේ අප තුළ සහ අප තුළින් කරන ක්‍රියාවන් උන්වහන්සේගේ සර්වබලධාරී බලයෙන් කරනු ලබයි. උන්වහන්සේ ප්‍රකාශ කරන හෝ ආඥා කරන දේ උන්වහන්සේගේ එම සර්වබලධාරී බලය කරුණුකොටගෙනම ඉල්ලා සිටිමින් ක්‍රියා කරනු ලබයි. උන්වහන්සේ ලබාදෙන සියල්ල උන්වහන්සේගේ බලයෙන්ම ලබාදෙන සේක. උන්වහන්සේ ලබාදෙන සෑම ආශිර්වාදයක්ම, උන්වහන්සේ ඉටුකරන සෑම පොරොන්දුවක්ම සහ උන්වහන්සේ ක්‍රියාකරන සෑම කාරණයක් තුළම උන්වහන්සේගේ සම්පූර්ණ බලය පවනතින්නේය. බලයේ සිංහාසනයේ සිටින යේසුස් වහන්සේගෙන් ලැබෙන සෑම දෙයක් තුළම උන්වහන්සේගේ බලයේ මුද්‍රාව දරා සිටින්නේය.

පාපයෙන් ආරක්ෂාවීමට, ශුද්ධකම තුළ වර්ධනයවීමට, බොහෝ ඵල දැරීමට ඉල්ලා සිටීමේදී දුර්වලම ඇදහිලිවන්තයාට පවා ඔහුගේ ඉල්ලීම දිව්‍යමය බලයෙන් ඉටුවන බව විශ්වාස කළ හැකිය. බලය යේසුස් වහන්සේ තුළ පවතින සේක. යේසුස් වහන්සේගේ මුළු පූර්ණත්වය අපගේය. බලය ක්‍රියාවට නැංවීම, ප්‍රකාශ කිරීම උන්වහන්සේගේ සාමජිකයන් (ගෝලයන්) වන අප තුලින් ඉටුකරන සේක.

2 පිටුවට

1 පිටුවෙන්

ඔබේ ශක්තිය ලෙස..

අප තුළ ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය

බලය ලබාදෙන්නේ කෙසේදැයි අපට දැන ගැනීමට අවශ්‍ය නම් පිළිතුර සරලව තිබේ. ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේගේ ජීවිතය අප තුළට ප්‍රදානය කිරීමෙන් උන්වහන්සේගේ බලය අප තුළට ප්‍රදානය කරන සේක. බොහෝ ඇදිහිලිවන්තයන් සිතන පරිදි උන්වහන්සේ ඔවුන්ගේ ජීවිතය තුළ ඇති දුර්වලතා සොයාගෙන ඔවුන්ගේ දුර්වල උත්සාහයන් සඳහා උන්වහන්සේගේ ශක්තියෙන් (බලයෙන්) ඉතා කුඩා කොටසක්වත් ප්‍රදානය නොකරන සේක කියාවේ. අප තුළ උන්වහන්සේගේ ජීවිතය තැබීමෙන් උන්වහන්සේ අපට තමන්වහන්සේගේ බලය ලබාදෙන සේක. ශුද්ධාත්මයාණන් වහන්සේ, ඔවුන්ගේ ස්වාමීන්වහන්සේගේ හදවතින් කෙළින්ම ගෝලයන් වෙතට බැස යේසුස් වහන්සේ ඇතුළු වූ ස්වර්ගයේ තේජාන්විත ජීවිතය ඔවුන් තුළට ගෙනාසේක. එබැවින් උන්වහන්සේගේ සෙනඟට තවමත් ස්වාමීන්වහන්සේ තුළ සහ බලයේ ආධිපත්‍යයෙන් ශක්තිමත්වීමට උගන්වනු ලැබේ. උන්වහන්සේ ඔවුන්ව ශක්තිමත් කරන විට එය ඉටුකරන්නේ දුර්වලකමේ හැඟීම් ඉවත්කර එම ස්ථානයට ශක්තියේ හැඟීම් ලබාදීමෙන් නොවේ. නමුත් ඉතා අනර්ඝ වූ මාර්ගය හැරදමා සම්පූර්ණ බෙලහීනතාවයේ හැඟීම් පවා වැඩි වන බව හැගෙන විට උන්වහන්සේ ඔවුන්ට උන්වහන්සේ තුළ ශක්තිය ලබාදීම පිළිබඳව අවබෝධ කර දෙන සේක. **“නුමුත් ඒ බලයේ ඉතා උතුම්කම අපට නොව දෙවියන් වහන්සේට අයිති වන පිණිස මේ වස්තුව අපි මැටි භාජනවල දරාමුව” (2 කොරින්ති 4:7) දුර්වලකම සහ ශක්තිය එකිනෙකට යාබදව ඇත. “උන්වහන්සේද, මාගේ කරුණාව නුඹට සෑහේය. මක්නිසාද දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණවන්නේ යැයි මට කී සේක. එබැවින් ක්‍රිස්තුස් වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටුකාරන්නෙමි. එහෙයින් ක්‍රිස්තුස් වහන්සේ උදෙසා පැවිණන දුර්වලකම්වලටත් අන්තරායවලටත් හිඟකම්වලටත් පීඩාවලටත් විපත්තිවලිටත් ප්‍රසන්නව සිටිමි. මක්නිසාද මම දුර්වලව සිටිනකලම ශක්තිමත්ව සිටිමි.” (2 කොරින්ති 12 : 910)** අපගේ දුර්වලකම තුළ දී උන්වහන්සේගේ බලය සම්පූර්ණ වන බව අවබෝධ කරගත යුතුය.

ඇදහිලිවන්ත ගෝලයන් සිංහාසනයේ සිටින ක්‍රිස්තුස් වහන්සේව එනම් සර්වබලධාරී ක්‍රිස්තුස් වහන්සේව තම ජීවිතය ලෙස දැකීමට ඉගෙනගනී. ඔහු එම ජීවිතය එහි අසීමිත පරිපූර්ණත්වයෙන් හා පාරිශුද්ධත්වයෙන්, එහි ශක්තියෙන් හා මහිමයෙන් අධ්‍යයනය කරනු ලබයි. එය මහිමයට පත් වූ මනුෂ්‍යයෙකු තුළ වාසය කරන සදාකාලික ජීවිතයයි. ඔහු තමාගේම අභ්‍යන්තර ජීවිතය ගැන සිතන විට ශුද්ධකම, දෙවියන් වහන්සේ ප්‍රසන්න වන ලෙස ජීවත්වීම හෝ පියාණන් වහන්සේගේ කාර්යය ඉටු කිරීමට බලය ලබා ගැනීම උදෙසා ආශා කරද්දී ඔහු ඉහළ බලන අතර ක්‍රිස්තුස් වහන්සේ තම ජීවිතය බව දැන ප්‍රීතියෙමින් එම ජීවිතය තමාට අවශ්‍ය සියල්ල ඔහු තුළ බලවත් ලෙස ක්‍රියාකරනු ඇතැයි විශ්වාසයෙන් සිටියි. කුඩා දේවලදී සහ මහත් වූ දේවල දී පාපයෙන් මොහොතින් මොහොත ආරක්ෂාවීමට හෝ යම් විශේෂ පරීක්ෂාවකට හෝ විශේෂ දුෂ්කරතාවයකට මුහුණදීමේ දී ක්‍රිස්තුස් වහන්සේගේ බලය උන්වහන්සේගේ අපේක්ෂාවේ මිණුම බව ඔහු ඉගෙනගනු ලබන්නේය. ඔහු වඩාත් ප්‍රීතිමත් සහ වඩාත් ආශිර්වාදලත් ජීවිතයක් ගතකරන්නේ ඔහු තවදුරටත් දුර්වල නොවන නිසා නොව සම්පූර්ණයෙන්ම අසරණව සිටින නිසා ඔහු බලවත් වූ ගැලවුම්කරුවාණන් සමඟ එකඟවීමෙන් උන්වහන්සේ තමන් තුළ ක්‍රියාකරනු ඇතැයි අපේක්ෂා කරන බැවිනි.

වැදගත් පාඩම්

මෙම සිතුවිලි අපට ප්‍රායෝගික ජීවිතය සඳහා උගන්වන පාඩම් සරල වුවත් ඒවා ඉතා වටිනා පාඩම්ය. පළමුවැන්න නම්, අපගේ මුළු ශක්තිය ක්‍රිස්තුස් වහන්සේ මත තබා ඇති අතර එය පාවිච්චි කිරීම සඳහා බලා සිටීමු. එය සර්වබලධාරී ජීවිතයක් ලෙස උන්වහන්සේ අප වෙනුවෙන් එහි පවතින සේක. එය අවස්ථාව විවෘතවෙන ප්‍රමාණයට අනුව ගලායාමට සූදානම්ය. එහි ප්‍රවාහය ශක්තිමත් හෝ දුර්වලවුවත්, ඒ පිළිබඳව අපගේ අත්දැකීම කුමක් වුවත් එය ක්‍රිස්තුස් වහන්සේ තුළ ඇත. ස්වර්ගයේ සහ පොළොවේ සියලු බලය යන ප්‍රකාශය අධ්‍යයනය කිරීමට අපි කාලය ගනිමු. යේසුස් වහන්සේ අපට පරිපූර්ණ ගැලවුම්කරුවෙකු විය හැකි පරිදි පියාණන් වහන්සේ උන්වහන්සේට සියලු බලය ලබා දුන් සේක යන සිතුවිලිවලින් අපගේ මනස පූර්ණකර ගනිමු. අපගේ අවශ්‍යතාවයන් සඳහා උන්වහන්සේට ගැලපෙන සුදුසුකම එයයි. ස්වර්ගයේ සියලු සහ පොළොවේ සියලු බලය උන්වහන්සේට දී තිබෙන බැවින් අපගේ හදවත්වල සහ ජීවිතවල සියලු බලයත් උන්වහන්සේ සතුව පවතින සේක.

දෙවන පාඩම නම්, අපි උන්වහන්සේ සමඟ සමීප එකමුතුවක රැඳී සිටින විට මෙම බලය අප තුළට ගලාඑන්නේය. උන්වහන්සේ සමඟ ඇති එකමුතුව දුර්වල වූ විට, වටිනාකම සහ වර්ධනය අඩු වූ විට ශක්තියේ ගලායාම දුර්වලවනු ඇත. ක්‍රිස්තුස් වහන්සේ සමඟ එක්සත්වීම අපගේ ඉහළම යහපත ලෙස ප්‍රීතිවන විට සහ එය පවත්වා ගැනීම සඳහා සියල්ල කැප කරන විට බලය ක්‍රියාත්මක වනු ඇත. **“අපගේ දුර්වලකමේදී උන්වහන්සේගේ බලය සම්පූර්ණ වන්නේය.”** එබැවින් අපගේ එකම සැලකිල්ල විය යුත්තේ අපගේ ශක්තිය ලෙස ක්‍රිස්තුස් වහන්සේ තුළ රැඳී සිටීමයි. අපගේ එකම යුතුකම වන්නේ ස්වාමීන්වහන්සේ තුළ උන්වහන්සේගේ ශක්තියේ බලවත්කම තුළ ශක්තිමත්වීමයි.

අපගේ ඇදහිල්ල විශ්වාස කරන අය තුළ දෙවියන් වහන්සේගේ අතිමහත් බලයේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳව විශාල හා පැහැදිලි අවබෝධයක් වර්ධනය වන්නේය. උට්ඨාන වූ සහ උසස් කරනු ලැබූ ක්‍රිස්තුස් වහන්සේ බලය තුලින් උන්වහන්සේගේ සෑම සතුරෙකුවම පරාජය කළ සේක. (එපීස 1:19-23) අපගේ ඇදහිල්ල දෙවියන් වහන්සේගේ අපූරු හා වඩාත්ම ආශිර්වාදලත් විධිවිධානවල හැටියට එකඟවේවා. අපගේම ලෙස අප තුළ ඇති දුර්වලතාවය හැර අන් කිසිවක් නැත. නමුත් ක්‍රිස්තුස් වහන්සේගේ සියලු බලය අප තුළ ඇතුවාක්මෙන් අපට ඊට ළඟාවිය හැකිය. අපගේ ඇදහිල්ල දිනපතා ස්වභාවිකවම සහ ඇදහිල්ලේ ජීවිතයෙන් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයට ඇතුල්වී අපගේ මුළු පැවත්මම උන්වහන්සේ තුළ ක්‍රියාත්මක කිරීම සඳහා උන්වහන්සේට භාරකරමු. සියල්ලටම වඩා උන්වහන්සේගේ සර්වබලධාරී බලයෙන් උන්වහන්සේ අප තුළ උන්වහන්සේගේ කාර්යය සම්පූර්ණ කරන බවට සහතිකවීම ගැන අපගේ ඇදහිල්ල විශ්වාසයෙන් ප්‍රතිමත් වේවා.

මෙසේ අප ක්‍රිස්තුස් වහන්සේ තුළ රැඳී සිටින විට ශුද්ධාත්මයාණන් වහන්සේ උන්වහන්සේගේ බලයේ ආත්මය අප තුළ බලවත් ලෙස ක්‍රියාත්මක කරන සේක. එබැවින් අපි මෙලෙස ගායනා කරන්නෙමු. "ස්වාමීන්වහන්සේ මාගේ ශක්තිය හා ගීතිකාවය, උන්වහන්සේ මාගේ ගැලවීම වී සිටින සේක." (ගීතාවලිය 118:14) "ධර්මිෂ්ඨකමත් බලයත් තිබෙන්නේ ස්වාමීන්වහන්සේ තුළ පමණක්ය කියා කෙනෙක් මට කියනවා ඇත." (යොසායා 45:24) "මා බලවත් කරන්නා වූ තැනැත්වහන්සේ තුළ මට සියලු දේ කරන්ට පුළුවන." (පිලිප්පි 4:13)

නොපසුබට උත්සාහයේ ආදර්ශයේ උල්පත ක්‍රිස්තුස් වහන්සේය.

රිව් කාර්මයිකල් විසිනි

මේ වසරේ මුලදී මම ඔබ සමඟ පරීක්ෂාවන් සහ කරදර කාලවලදී ඔබගේ ස්ථාවරය පවත්වා ගැනීම පිළිබඳව දිරි ගැන්වීමේ වචනයක් බෙදා ගත්තෙමි. එම පණිවිඩයේ දී මම යාකොබ් 5:11 වන පදයෙන් යෝබිගේ නොපසුබට උත්සාහය පිළිබඳ සඳහන් කාරණය වෙත කෙටියෙන් ඔබගේ අවධානය යොමු කළෙමි.

“ඉවසූ අය ආශීර්වාද ලද්දෝ යයි අපි කියමුව. යෝබිගේ ඉවසීම ගැන නුඹලා අසා තිබේ. ස්වාමීන්වහන්සේගේ තීරණය ද නුඹලා දුටුවහුය. ස්වාමීන්වහන්සේ බොහෝ අනුකම්පාව ඇත්තා වූ දායවන්ත වූ කෙනෙක්ය.” (යාකොබ් 5:11) ඒකාලයේ සිට මම එම බයිබල් කොටස පිළිබඳව බොහෝ දේ සිතුවෙමි. විපත්තිවලට මුහුණදෙන ඔබ සඳහා එයින් අමතර අදහස් කිහිපයක් පහතින් සඳහන් කරමි. එහි ක්‍රිස්තුස් වහන්සේගේ නොපසුබට උත්සාහය අපට ලබාගත හැකි ආකාරය පිළිබඳ ඉතා දිරිගන්වන වචනයක් වනු ඇතැයි මම විශ්වාස කරන දේ ඔබ සමඟ බෙදා ගනිමි.

යෝබිගේ දුක්විඳීම

යෝබි සම්බන්ධයෙන් ගත් කළ පැහැදිලිවම ඔහු භයානක දේවලට මුහුණ දුන්නේය. ඔහුට තම දේපල අහිමි විය. ඔහුට තම පවුල අහිමි විය. අවසානයේ දී ඔහුට තම සෞඛ්‍යය ද අහිමි විය. මේ සියල්ල තමාට සිදුවන්නේ මන්දැයි යන තේරුම්ගත නොහැකි ප්‍රශ්නයට ද ඔහු මුහුණ දුන්නේය. එහිත් පාඩුව අවිනිශ්චිතභාවය මධ්‍යයේ වුවද ඔහු ස්වාමීන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල තබාගත්තේය. ඔහුගේ බිරිඳ ඔහු තවදුරටත් දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබාගෙන සිටින්නේ මන්දැයි විමසූ විට, දෙවියන් වහන්සේව අතහැර මැරෙන ලෙස පැවසූ විට, යෝබි මෙලෙස පිළිතුරු දුන්නේය. එහෙත් ඔහු ඇට කථාකොට, නුඹ අඥාන ස්ත්‍රීන්ගෙන් එක්කෙනක් කථාකරන්නාක් මෙන් කතා කෙරෙහිය. අපි දෙවියන් වහන්සේගේ අතින් යහපත පිළිගනිමු නම් අයහපතක් පිළිගන්ට ඕනෑ නොවේදැයි කීවේය. මේ සියල්ලේ දී යෝබ් වචනින් පව් කළේ නැත. (යෝබ් 2:10)

ස්වාමීන්වහන්සේගේ අරමුණ - කරුණාව සහ දායනුකම්පාව

යෝබ් විඳ දරාගත් සියල්ල සඳහා ස්වාමීන්වහන්සේට අරමුණක් තිබූ බව යාකොබ් පෙන්වා දෙයි. ස්වාමීන්වහන්සේ විසින් අදහස් කරන ලද අවසානයක් තිබුණි. අවසානයේ දී ස්වාමීන්වහන්සේ යෝබිට මහත් එළිදරව්වීමක් ලබා දුන් බවත්. (යෝබ් 42:5) ඔහුගේ අලාභවීම් යථා තත්ත්වයට පත් කළ බවත්, කලින් තිබුණාක් මෙන් දෙගුණයක් ස්වාමීන්වහන්සේ ඔහුට ලබා දුන් බවත්, ඔහුගේ අවසාන කාලයේ දී ආරම්භයට වඩා ආශිර්වාද කළ

3 පිටුවට

නොපසුබට උත්සාහයේ...

2 පිටුවෙන්

බවත් අපි දනිමු. (යෝබ් 42:10,12) වෙනත් වචන වලින් කිවහොත් මුළු පීඩාව පුරාම ස්වාමීන්වහන්සේ සමීපව සම්බන්ධ වූ අතර අවසානයේ එය වෙනත් ආකාරයකින් පෙනෙන්නට තිබුණත් යෝබ් හොඳම දේ සඳහා ක්‍රියාකලහ.

මේසම්බන්ධයෙන්යාකොබ්පෙන්වාදෙන්නේ ස්වාමීන්වහන්සේ ඉතා කරුණාවන්තව සහ දයාවෙන් පූර්ණ බවයි. ඕනෑම විපත්තියකට මුහුණ දෙන ඕනෑම කෙනෙකුට මෙම බයිබල් පදය මහත් දිරිගැන්වීමේ මූලාශ්‍රයක් විය යුතුය. එවැනි අවස්ථාවලදී අපට නොතේරෙන බොහෝ දේ තිබිය හැකි වුවද අපි නිසැකවම දන්නා වූ එක් දෙයක් නම් දෙවියන් වහන්සේ අප කෙරෙහි කරුණාවෙන් හා දයානුකම්පාවෙන් පිරී සිටින බවයි. යෙරමියා අපට මතක්කර දෙන පරිදි **"අප විනාශනූණේ ස්වාමීන් වහන්සේගේ කරුණාවල් නිසාත් උන්වහන්සේගේ අනුකම්පාවල් නොනවතින නිසාත්ය. ඒවා උදයෙන් උදය අලුත්ව තිබේ. ඔබගේ විශ්වාසකම මහත්ය. මාගේ කොටස නම් ස්වාමීන්වහන්සේ යයි මාගේ ආත්මය කියයි. එබැවින් උන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තු වන්නෙමි." (විලාප ගී 3:22-24)** එය මොනතරම් තේජාන්විත සත්‍යතාවයක්ද ?

දෙවියන් වහන්සේ දයාවෙන් අපව උසුලන සේක. උන්වහන්සේගේ දයාව කිසිදාක අසාර්ථක නොවේ. ඒවා සෑම උදෑසනකම අප උදෙසා අලුත්ව තිබේ. උන්වහන්සේගේ විශ්වාසකම මහත්ය.

යෙරමියා මෙම සත්‍යතාවය ප්‍රකාශ කරන්නේ මහත් පීඩාවක් මධ්‍යයේ සිටියදී ඔහුගේම ශක්තිය හා බලාපොරොත්තුව විනාශවී ගිය විට බව මතක තබාගන්න. විලාප ගී 3:1-20 දක්වා පදන බලන්න. නමුත් ඔහු ස්වාමීන්වහන්සේගේ දයානුකම්පාව සිහිකරන විට උන්වහන්සේගේ විශ්වාසවන්තකම පිළිබඳව ඔහු උන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තුවෙන් පිරී සිටින්නේය.

මෙම ගති ලක්ෂණ දෙවියන් වහන්සේගේ මනුෂ්‍යයන්ට සහ ඔවුන්ගේ චරිතයට අත්‍යාවශ්‍යවීම කොයිතරම් දිරිගන්වන සුළු සහ සැනසිලිදායකද? උන්වහන්සේ කරුණාවෙන්, දයාවෙන් සහ විශ්වාසවන්තකමෙන් පූර්ණ දෙවියන් වහන්සේ වන සේක. එබැවින් අපට ඒ අනුව ක්‍රියා කිරීමට උන්වහන්සේ මත සම්පූර්ණයෙන්ම රැඳී සිටිය හැකිය. උන්වහන්සේ අපට ප්‍රේම කරමින් අප ගැන ගැඹුරින් සැලකිලිමත් වන අතර සෑමවිටම අපගේ උපරිමය සඳහා ක්‍රියාකරන සේක. තවද දෙවියන්වහන්සේට ප්‍රේමකරන්නන්ට, එනම් උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස දැකවනු ලැබූවන්ට, සියලුදේම යහපත පිණිස එකට ක්‍රියාකරන බව අපි දනිමුව. (රෝම 8:28) අපි කුමන දෙයක් අත්විඳිමින් සිටියත් අපට ස්වාමීන්වහන්සේ දෙස බලා උන්වහන්සේගේ දයාව, අනුකම්පාව සහ විශ්වාසවන්තකම අනුව උන්වහන්සේ අපගේ ජීවිතවල ක්‍රියාකරන බව නිසැකවම දැනගත හැකිය. උන්වහන්සේව සම්පූර්ණයෙන්ම විශ්වාස කිරීමට සහ නොපසුබට උත්සාහය නොකඩවා පවත්වාගෙනයාමට අපට වන්නා වූ සෑම හේතු සාධකයක්ම ලබා දී තිබෙන සේක.

ක්‍රිස්තුස් වහන්සේගේ නොපසුබට උත්සාහයෙන් ප්‍රයෝජන ගන්න.

"දැන් ස්වාමීන්වහන්සේ, ඔබගේ හදවත් දෙවියන් වහන්සේගේ ප්‍රේමයටත්, ක්‍රිස්තුස් වහන්සේගේ ඉවසීමටත් යොමු කරන සේක්වා" (2 තෙසලෝනික 3:5) යන දිරිගැන්වීමේ වචනය අපට සම්පූර්ණයෙන්ම සිතට ගත හැකිය. මෙම පදයේ ඉවසීම ලෙස පරිවර්තනය කර ඇති වචනය යාකොබ 5:11 වන පදයෙහි නොපසුබට උත්සහය (ඉවසීම) ලෙස පරිවර්තනය කර ඇති වචනයම වේ. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම **"යටතේ සිටීම"** හෝ **"යටතේ වාසය කිරීම"** අදහස් කරන්නේය. නොපසුබට උත්සාහය යනු පරීක්ෂාවන් ඉවසිලිවන්තව විඳ දරාගැනීම සහ ඒවා මධ්‍යයේ ස්වාමීන්වහන්සේ තුළ ස්ථිරව සිටීමයි. එයට ඉදිරි දැක්මකට, වර්තමාන පීඩාවලින් ඔබ්බට ඇති දේ කෙරෙහි අවධානය යොමු කිරීමේ හැකියාව ඇත.

මේ සඳහා වඩාත් වැදගත්ම උදාහරණය නම්, යේසුස් වහන්සේ කුරුසියට යාමේ දී දැක් වූ නොපසුබට උත්සාහයයි. හෙබ්‍රෙව් පොතේ කතෘවරයා මෙසේ සඳහන් කරන්නේය. එබැවින් මෙපමණ මහත් සාක්ෂිකාර සේනාවකින් අප වටව සිටින නිසා සියලු බර ද පහසුවෙන් අප හසුකරන පාපය ද අහකදමා, ඇදහිල්ලේ කතෘවරයා ද, සම්පූර්ණ කරන්නා ද වූ යේසුස් වහන්සේ දෙසම බලමින්, අප ඉදිරියෙහි තබා තිබෙන දිවීම ඉවසිල්ලෙන් දුවමු. උන්වහන්සේ වනාහී තමන් ඉදිරියෙහි තබා තිබුණු ප්‍රීතිය නිසා ලැජ්ජාව නොසලකා, කුරුසිය දරාගෙන පසුව දෙවියන් වහන්සේගේ සිංහාසනයේ දකුණු පැත්තෙහි වැඩහිඳින සේක. ඒ නිසා නුඹලා නුඹලාගේ සිත්වලින් ක්ලාන්තවී වෙහෙස නොවන පිණිස තමන්ට විරුද්ධව සිටිය පව්කාරයන්ගෙන් එපමණ විරුද්ධකම් ඉවසූ තැනැත්වහන්සේ කල්පනාකර බලාපල්ලා (හෙබ්‍රෙව් 12:1-3) යේසුස් වහන්සේ අත්වින්දා වූ සතුරුකම, අයුක්තිය, වේදනාව, ලැජ්ජාව සහ දුක්වේදනා අපට සම්පූර්ණයෙන්ම තේරුම් ගතහැකි ඕනෑම දෙයකට වඩා වැඩිය. එහෙත් උන්වහන්සේ ඒ සියල්ලේ දී පසුබට නොවීය. **"මනුෂ්‍යාකාරයෙන් සිටිය කලත්, මරණය එසේය. කුරුසියේ මරණය දක්වා කීකරු වූ සේක."** (පිලිප්පි 2:8)

යේසුස් වහන්සේට එය පහසුවූයේද නැත. එය ඉතාම අසීරුය. එම නිසා උන්වහන්සේ කලින්ම මෙසේ යාච්ඤා කළ සේක. **"උන්වහන්සේ වදක් ඉස්සරහටගොස් මුහුණින් වැටී, අහෝ මාගේ පියාණෙනි, වේ කුසලාන මා කෙරෙන් පහවෙන්ට පුළුවන් නම් එසේ වේවා. ඒසේ වී නුවුත් මා කැමති ලෙස නොව ඔබ කැමති ලෙස වේවායි කියා යාච්ඤා කළ සේක."** (මතෙව් 26:39) උන්වහන්සේ ඉතා වේදනාවෙන් සිටි බැවින් උන්වහන්සේ වඩාත් උනන්දුවෙන් යාච්ඤා කළ සේක. **"උන්වහන්සේ මහත් වේදනා වින්ද සේක් වඩා ඕනෑකමින් යාච්ඤා කළ සේක. උන්වහන්සේගේ ඇදිය ද මහත් ලේ බින්දු මෙන් බිම වැටුණේය." (ලූක් 22:44)** උන්වහන්සේ තම පියාණන් වහන්සේගේ කැමැත්තට සම්පූර්ණයෙන්ම යටත්වී කුරුසියට ගිය අතර එහිදී යේසුස් වහන්සේ තම ආත්මය පියාණන් වහන්සේගේ අතට භාරදුන් සේක. (ලූක් 23:46) තවද දින තුනකට පසුව පියාණන් වහන්සේ උන්වහන්සේගේ මහත් විශ්වාසවන්තකම සහ උන්වහන්සේගේ බලවත් වූ බලයෙන් යේසුස් වහන්සේව මළවුන්ගෙන් නැගිටුවා උන්වහන්සේව ඉතා උසස්කොට සෑම නාමයකටම වඩා උසස් වූ නාමයක් උන්වහන්සේට දුන් සේක. (එපීස 1:20-21, පිලිප්පි 2:9) දෙවියන් වහන්සේ සෑමවිටම කරන්නාක් මෙන්, උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබා නොපසුබට උත්සාහය දරණ සියල්ලන්ටම උන්වහන්සේ හොඳම දේ ලබාදීම සඳහා ක්‍රියාකරන සේක.

අපගේ නොපසුබට උත්සාහයේ උල්පත

එබැවින් යේසුස් වහන්සේ අපට නොපසුබට උත්සාහය පිළිබඳ අපූර්ව වූ ආදර්ශයකි. නමුත් උන්වහන්සේ ඊටත් වඩා බොහෝ සෙයින් වැඩිය. උන්වහන්සේ අපගේ නොපසුබට උත්සාහ සඳහා ශක්තියේ මූලාශ්‍රය ද වන සේක. ක්‍රිස්තුස් වහන්සේ මරණයෙන් නැවත නැගිටීමෙන් අප සමඟ එක්වීම නිසා අපට උන්වහන්සේගේ ජීවිතය අප තුළ ඇත. ක්‍රිස්තුස් වහන්සේම අප තුළ සිටින සේක. උන්වහන්සේ අපගේ ඇදහිල්ලේ කතෘවරයා සහ සම්පූර්ණ කරන්නා ද වන අතර අපි සියලු දේ උදෙසා උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබමු. අපට උන්වහන්සේගෙන් වෙන්ව කිසිවක් කළ නොහැකි අතර. උන්වහන්සේ අපව ශක්තිමත් කරන විට අපට උන්වහන්සේ තුළ සියල්ල කළ හැකිවේ. (යොහාන් 15:5, පිලිප්පි 4:13) උන්වහන්සේගේ සෙනඟ වශයෙන් **"ප්‍රීතිය ඇතුව සියලු ආකාර ස්ථිරකමටත්, ඉවසිලිවන්තකමටත් උන්වහන්සේගේ තේජසේ පරාක්‍රමයේ හැටියට සියලු ආකාර බලයෙන් ශක්තිමත් වෙමින් ..." (කොලොස්සි 1:11)** සිටීමට අපට පුළුවන. ක්‍රිස්තුස් වහන්සේම පවසන පරිදි, **"උන්වහන්සේ ද, මාගේ කරුණාව නුඹට සෑහේය. වක්නිසාද දුර්වලකමේ දී මාගේ බලය සම්පූර්ණවන්නේ යයි මට කී සේක ...." (2 කොරින්ති 12:29)**

ඉතින් මේ අන්තිම දවස්වල ඔබ පරීක්ෂා සහ කරදරවලට මුහුණ දෙන විට ක්‍රිස්තුස් වහන්සේගේ ආදර්ශය කෙරෙහි සහ ඔබ තුළ ක්‍රියාත්මක වන උන්වහන්සේගේ ජීවිතය සහ බලය කෙරෙහි ඔබගේ දැස් යොමුකර තබා ගැනීමට මම ඔබව දිරිමත් කරමි. ඔබේ ජීවිතය උන්වහන්සේගේ පැමිණීම, උන්වහන්සේගේ බලය, උන්වහන්සේගේ කරුණාව, උන්වහන්සේගේ ප්‍රේමය, උන්වහන්සේගේ දිරිගැන්වීම සහ උන්වහන්සේගේ ස්ථීරභාවයෙන් පුරවන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. ඔබ මුහුණ දෙන ඕනෑම විපත්තියක් හරහා ඉදිරියට යාමටත්, ඔබ තුළ සහ ඔබ තුලින් උන්වහන්සේගේ හදවතේ ඇති සියල්ල ඉටුකිරීමට ඔබට උපකාර කරන ලෙසත්, උන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. සියලු දේ උන්වහන්සේගේ මහිමය උදෙසා වන්නේය.

ආශිර්වාදලත් ජීවිතයේ දෙවියන්වහන්සේගේ රහස්

ඔබට බලය නොමැතිකම ගැන සමහරවිට ඔබ කෙදිරිගාන්නේ නැද්ද ? ඔබ සාතන්ගෙන් පීඩාවිඳින මනුෂ්‍යයන් සමඟ මුහුණට මුහුණ සිටගෙන සිටියත් ඔබට යක්ෂයා දුරකළ නොහැකිව තිබේ. ඔබේ වැඩකරන ස්ථානයේදී, ව්‍යාපාරික ස්ථානයේ දී, නිවසේ දී සහ සෙසු අයට ක්‍රිස්තුස් වහන්සේ තුළ වරද පිළිගෙන පාපොච්චාරණය කළ යුතු යැයි ඔබට හැඟෙන නමුත් ඔබේ තොල්, ඔබගේ හදවතේ පණිවිඩය ප්‍රකාශ කිරීම ප්‍රතික්ෂේප කරයි.

ඔව්, ඒ සියල්ලටම වඩා දුෂ්කර දෙය නම් ඔබ අකැමති තැනකට ඔබව ගෙනයන පාපයෙන් ඔබ නිරන්තයෙන් ජය ගනිමින් සිටීමයි. කණගාටුදායක ලෙස අප අතරේ බලය නොමැතිකම පවතී. බොහෝ දෙනෙක් දොරටුවලින් සටනේ රැල්ල ආපසු හැරවීමට නොහැකිව හෝ පැරණි කාලයේ ශුද්ධවන්තයන්ට

(එෆ්.බී. මේයර් විසිනි.) (1847-1929)

මෙන් ආත්මික යුද්ධායුධ පාවිච්චි කිරීමට නොහැකිව ළමයින් මෙන් සෙල්ලම් කරමින් සිටිති. එය අපගේ හැකියාවන් හෝ සුසුදුසුකම් පිළිබඳ ප්‍රශ්නයක් නොව, අප පිටුපස ඇති බලය පිළිබඳ ප්‍රශ්නයයි. එය මිනිස් බලයට

4 පිටුවට

3 පිටුවෙන්

ආශීර්වාදලත් ජීවිතයේ...

වඩා වැඩි දෙයක් නොවේ නම් ප්‍රතිඵලය දුක්ඛිත ලෙස දුර්වලවීම පුදුමයක් නොවේ. අපි දෙවියන් වහන්සේගේ සදාකාලික බලයට සම්බන්ධ වන විට අපට කළ නොහැකි දෙයක් නැත. **"යේසුස් වහන්සේ උත්තර දෙවින්, ඔබට පුළුවන් නම් විශ්වාස කරන්නාට සියල්ල පුළුවනැයි කී සේක."** **(මාර්ක් 9:23)** වැදගත්ම දෙය නම්, ඇදහිල්ල සම්බන්ධවී තිබෙන පටිය හොඳින් භාවිතා වන බව දැකීමයි. මිදිවැල අත්හැර දමා අත්තකට කිසිවක් කළ නොහැකිය. එම නිසා දෙවියන් වහන්සේගේ බලය මට සොයාගත හැකි කොතනින්ද ?

දෙවියන් වහන්සේගේ බලය ගබඩාකර ඇති ජලාශය යේසුස් ක්‍රිස්තුස් වහන්සේය. "උන්වහන්සේ සියල්ලටම පළමුවෙන් සිටින සේක. සියල්ල ද උන්වහන්සේ තුළ පවතින්නේය. උන්වහන්සේ සභාව නැමති ශරීරයට හිස්ව සිටින සේක. උන්වහන්සේ පටන්ගැන්මව මළවුන්ගෙන් කැළඹුලාව සිටින සේක. එසේව සිටින්නේ උන්වහන්සේම සියල්ලට ප්‍රධානව සිටින පිණිසය. මක්නිසාද උන්වහන්සේ තුළ වුළු සූර්ණකම පැවතීමටත් උන්වහන්සේගේ කැරැසියේ ලෙයින් සමාදානය උපදවා, උන්වහන්සේ කරුණුකොටගෙන සියලු දේ එනම් පොළොවෙහි තිබෙන දේවල් වුවත්, ස්වර්ගවල තිබෙන දේවල් වුවත්, උන්වහන්සේ කරුණුකොටගෙන තමන්ට සමගිකර ගැනීමටත්, පියාණන් වහන්සේ ප්‍රසන්න වූ සේක." **(කොලොස්සි 1:17-20)** සියලු බලය උන්වහන්සේය. පරීක්ෂා කන්දේදී උන්වහන්සේ එය යක්ෂයාගෙන් ලබාගත්තා නොවේය. නමුත් උන්වහන්සේව ස්වර්ග යට ඔසවාගනු ලැබූ කන්දේදී ඊට හිමිකම්පෑවේය. උන්වහන්සේගේ තේජාන්විත වචනවලට සවන්දෙන්න. **"යේසුස් වහන්සේ ඔවුන් ළඟට ඇවිත් කථාකොට ස්වර්ගයෙහි ද, පොළොවෙහිද, සියලු බලය මට දී තිබේ."** **(මතෙව් 28:18)**

ඒ උතුම් මොහොතේ දී උන්වහන්සේ මනුෂ්‍ය පුත්‍රයා ලෙස තමන්වහන්සේට තිබූ බලය ලෝකය ඇතිවීමට පෙර පියාණන් වහන්සේ සමඟ තිබූ බලය සමඟ තමන්වහන්සේ තුළ එක්සත් කළ සේක. දැන් සියලු බලය සදාකාලයටම උන්වහන්සේ තුළ පවතින සේක. උන්වහන්සේට පමණක් නොව අප වෙනුවෙන් ද එය පවතින්නේය.

මේ බලය ලැබෙන්නේ කෙසේද ? ඇදහිල්ලෙනි, ඔබ යම් දුෂ්කරතාවයකට, පරීක්ෂාවකට හෝ යම් සේවයකට මුහුණදෙන සෑම අවස්ථාවකම ඔබගේ හදවත ජීවමාන ගැලවුම්කරුවාණන් වෙත ඔසවන්න. උන්වහන්සේ වෙත අවධානය තබන්න. ඔබ පවසන වචනය සහ එය පැවසීමට ශක්තිය සඳහා උන්වහන්සේ මත රඳා පවතින බව උන්වහන්සේට දැනෙන්ට සලස්වන්න. සැගවුණු උල්පත්වලින් විල් පිරියන පරිදි වහාම ඔබේ හදවත තුලට බලය ගලාඒමක් ඇති වේ.

නමුත් මගේ ඇදහිල්ල දුර්වලවීය. මගේ අවශ්‍යතා ඇති මොහොතේ දී ඇදහිල්ලෙන් බලන්න අමතක වෙනවා. මම බලනකොට එයින් මට ලොකු උදව්වක් ලැබෙන බවක් පේන්න නැහැ. දුර්වල ඇදහිල්ල තුළින් සාමාන්‍යයෙන් පෙන්නුම් කරන්නේ අභ්‍යන්තර ජීවිතයේ යම් වැරැද්දක් ඇති බවයි. හේතුව සොයා ගැනීමට ඔබවම සෝදිසි කර බලන්න. ඔබ පරීක්ෂාවට යටත් වෙනවාද ? ජයගනු ලබන්නා වූ සෑම පරීක්ෂාවක්ම ආත්මික ජීවිතයේ බලය වැඩිවීමකි. නමුත් ඉඩදෙන්නා වූ සෑම පරීක්ෂාවක්ම ඔබගේ ශක්තියේ නහර (පටක) කපාදමා ඔබගේ බලයේ අගුල් බිඳ දමන්නේය.

ඔබ දෙවියන් වහන්සේට සම්පූර්ණයෙන් යටත්වී තිබේද ? බොහෝ විට අසාර්ථකත්වය, කැපකිරීමක් නොමැතිකම පෙන්නුම් කරයි. ඔබ තුළ තමන්ව ඕනෑවට වඩා කැපී පෙනෙන්නේ නැද්ද ? ගැලවීම ලැබීමට පෙර ඔබ ජීවත් වූයේ අධාර්මික ආත්මයක කේන්ද්‍රයේ සිටය. දැන් ඔබ අධාර්මික ආත්මයක කේන්ද්‍රයේ සිට ජීවත් නොවන බව ඔබට සම්පූර්ණයෙන්ම විශ්වාසද ..?

"දෙවියන් වහන්ස .... , මෙම අධාර්මික ආත්මයේ ක්‍රියාකාරීත්වයේ දුර්වල ලක්ෂණ සහ මූලාශ්‍රය මට පෙන්වන්න. එවිට මට මෙම ආත්මය දැන ගැනීමට සහ ඊට විරුද්ධවීමට හැකිවනු ඇත. "

මොහොතකට සිතන්න. දෙවියන් වහන්සේගේ කාර්යය කිරීමට සැලසුම් කිරීමේ දී ඔබ බොහෝ විට ඔබව පොළඹවූයේ කාගේ ආත්මයදැයි කිසිවිටෙකත් නොසිතා ඊට යොමුවීමට ඉක්මන් වන්නේ නැද්ද ? ඔබෙ සියලු කුඩා යෝජනා ක්‍රමවලදී ඔබට උදව්කරන ලෙස නිරන්තරයෙන් දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටින්නේ නැද්ද ? පළමුව උන්වහන්සේ ඒවා අනුමත කළේ දැයි විමසන්නේ නැතිව, නැතහොත් උන්වහන්සේගේ අතේ ඇති දේ දැන ගැනීමට උත්සාහ කරන්නේ නැතිව සහ ඔබට උදව් කිරීමට උන්වහන්සේට හැකිද යන්න සොයා බලන්නේ නැතිව ඒවාට යොමුවෙනවාද ? සියල්ල සිදු වූ පසුව නිහතමානීකමේ ඇඳුමෙන් සැරසී සිටියද උඩඟු අයට විරුද්ධවන තැනැත්වහන්සේට අප්‍රසන්නවන තමාටම සුභපතන්නා වූ ආත්මයක් ඔබ තුළ නැද්ද ?

"මට වෙනස් විය හැකි කෙසේද ? අන් අයට ආශීර්වාදයක්වීමේ සහ මුදා ගැනීමේ මෙම ආශීර්වාදලත් භාස දිනාගත හැකි නම් ඕනෑම දෙයක් අත්හැරීමට මම සූදානම්ව සිටින්නෙමි."

ඉන්පසු ඔබේ මුළු ආත්මයම යේසුස් වහන්සේට භාරදෙන්න. උන්වහන්සේගේ ලේ වලින් ඔබව මිලදීගත් සේක. දැන් ඔබේම ප්‍රීතිමත් තෝරා ගැනීමෙන් උන්වහන්සේගේ වෙන්න. පූජාවක් ලෙස පූජාසනයේ අංවලට ඔබවම බැඳගන්න.

ඔබගේ ආත්මය. ප්‍රාණය. ශරීරය භාරදෙමින් උන්වහන්සේගේ වීමට ඔබව භාරදෙන්න. උන්වහන්සේට පැමිණ ඔබට රැගෙන යන ලෙස ඉල්ලා සිටින්න. මේ ප්‍රීතිමත් පැයේ සිට උන්වහන්සේගේ මාර්ගය, උන්වහන්සේගේ කැමැත්ත, උන්වහන්සේගේ ආඥාවන් තුළ සියල්ල ලැබීමට ඔබ එකඟ බව උන්වහන්සේට කියන්න. සෑම දිනකම මම උන්වහන්සේගේ යැයි නැවත නැවත කියන්න.

"එසේ වී නමුත් මම මේ ආකාරයෙන් උන්වහන්සේට සම්පූර්ණයෙන්ම මාව භාරදීමට උත්සාහ කළ හොත් උන්වහන්සේ මාව භාරගන්න බව දැනගන්නේ කෙසේද ..? "

මුලින්ම ඔබට එය දැනගත හැකි වන්නේ ඇදහිල්ලෙන් පමණි. උන්වහන්සේ අපට ලබා දෙන්නා වූ දේ පිළිබඳව උන්වහන්සේගේ වචනයේ පොරොන්දු වී තිබෙන සේක. ඔබ ඔබගේම ජීවිතය උන්වහන්සේට භාරදෙන්නේ නම්, උන්වහන්සේගේ වීමට උත්සාහ කරන්නේ නම්, ඊට කැමැත්ත දක්වන්නේ නම්, ඒ මොහොතේම උන්වහන්සේ ඔබව උන්වහන්සේගේ කරගන්නා සේක. ඒ මොහොතේ සිට ඔබ ප්‍රේමයේ, බලයේ සහ ආශීර්වාදයේ උදාවීම වන හිමිකාරිත්වයේ බැඳීම තුළ උන්වහන්සේගේය. කාලය ගෙවීයද්දී ඔබ උන්වහන්සේට අයිතිවීමේ මිහිරියාව වැඩි වැඩියෙන් රසවිඳීමට ඔබට හැකිවන්නේය.

ඔබගේ හදවතට ප්‍රීතියේ පූර්ණත්වය මෙන්ම බලයේ පූර්ණත්වය ද පැමිණෙනු ඇත. ඔබේ කාර්යයන් ඉටුකිරීමට පටන් ගැනීමට පෙර බොහෝ බලයක් හෝ වෙනත් දෙයක් ඇති බව ඔබ නොදැන සිටිය හැකිය. නමුත් ඔබ ආරම්භ කළ විට මහලේ රෝහී කාන්තාවකට සුවය ගෙන දුන් උන්වහන්සේගේ ඇඳුමේ දාවල්ල (වාටිය) මෙන් පොදු වචන බලවත් කරන ගුණධර්ම ඔබෙන් පිටවන බව ඔබ දැනගන්නවා ඇත.

"නමුත් ඔබ මෙම ආශීර්වාදලත් තත්ත්වයේ රැඳී සිටින්නේ කෙසේද ?"

යේසුස් වහන්සේ ඒ පිළිබඳව සොයා බලන සේක. ඔබව විශ්වාසයෙන් තබා ගැනීමට උන්වහන්සේව විශ්වාස කරන්න. ප්‍රථමයෙන් එය ඔබව දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ තබා ගැනීමට දරණ උත්සාහයක් විය හැකි නමුත් අවසානයේ දී ඔබ තුළ උන්වහන්සේගේ ස්වභාවය වන තුරු එය පහසුවෙන් ක්‍රියාත්මක වන්නේය. එවිට ඔබ උන්වහන්සේට පවසන දේට වඩා උන්වහන්සේ ඔබට පවසන දේ ගැන සිතනු ඇත. එවිට උන්වහන්සේගේ හඬේ කුඩාම ශබ්දය. උන්වහන්සේගේ කැමැත්තේ කුඩාම සංකේතය අල්ලා ගැනීමට ඔබ සෑමවිටම අවදියෙන් සිටිනු ඇත. එවිට ඔබ සෑම සැලැස්මක්ම සහ සෑම අරමුණක්ම ක්‍රියාත්මක කිරීමට පෙර ඒවා ඔබගේ ප්‍රේමණීය ස්වාමීන්වහන්සේට ඉදිරිපත් කරනු ඇත.

එවිට ඔබට සෑමවිටම ඔබ උන්වහන්සේගේ ශරීරයේ සාමාජිකයෙකු බවත්, ගමන් කළ යුතු දිශාව සහ අවශ්‍ය සියලු ශක්තිය උන්වහන්සේ මත එනම් හිස වන උන්වහන්සේ මත පවතින බවත් හැගෙනු ඇත. එවිට ඔබේ තොල්වල ස්වාමීනී ඊළඟට කුමක්ද ? යන වචන ඇති අතර අන් අයට සුළු හෝ තේරුමක් නැතැයි පෙනෙන තත්ත්වයන් තුළ ඔබ උන්වහන්සේගේ කැමැත්ත දකිනු ඇත. උන්වහන්සේ ඔබට ගමන් කිරීම සඳහා කුමන ආකාරයේ යහපත් ක්‍රියා සූදානම් කර ඇද්දැයි සොයා ගැනීමට ඔබ සෑම දිනකම අවදියෙන් සිටිනු ඇත. ඔබට සිදුවන සියල්ල උන්වහන්සේගේ අතින් සහතික කරන ලද උන්වහන්සේගේ ප්‍රේමයේ රහස් ලිපි ගෙනැවිත් ඔබට කුමක් කළ යුතුදැයි පවසන පණිවිඩකරුවන් ලෙසවනු ඇත.

කිසිවක් වැරදි හෝ අහම්බෙන් සිදුවන බවක් නොපෙනේ. ඔබේ මුළු ජීවිත කාලය පුරාම ඔබ උන්වහන්සේ සමඟ කථා කරන තුරු සෑම දෙයකදීම ඔබට උන්වහන්සේ සමඟ නිශ්චිත සහයෝගීතාවයක් ලැබෙනු ඇත. ඔබ උන්වහන්සේ තුළ රැඳී සිටින අතර උන්වහන්සේ ඔබ තුළ රැඳී සිටින සේක. එම ස්ථිර එකමුතුවෙන් ස්ථිර බලයක් පැමිණෙනු ඇත. මන්ද උන්වහන්සේගේ බලය එහි සියලු තේජසින් ඔබ තුළ පවතිනු ඇත. විශාල දිය ඇල්ලක් වේගයෙන් නොකඩවා පාෂාණ සහිත ද්‍රෝණියකට කඩා හැලීමෙන් එය මනුෂ්‍යයන්ගේ කෙත් වලින් සහ නිවෙස් වලින් ඉඩෝරය සහ සාගතය වේගයෙන් ඉවත්කර දමයි.

"ඒක සාධාරණ (සතුටුදායක) දර්ශනයකි. එහි සුන්දරත්වය මාගේ දිළිඳු ජීවිතයේ භාභිර කෙළවර පවා ස්පර්ශ වෙනවාට මම කැමැත්තෙමි. නමුත් ඒක මට නොවේ යැයි බියවෙමි. "

නමුත් ඔබ උන්වහන්සේට දොර විවෘත කිරීමට කැමති වුවහොත් එය ඉටුවන්නේය. උන්වහන්සේ දොර ළඟ සිට තට්ටුකරන සේක. යම් කෙනෙක් දොර විවෘත කළහොත් උන්වහන්සේ ඇතුළට එන සේක. උන්වහන්සේට ඇතුළට පැමිණීමට ඉඩ ලබාදීමට ඔබ කැමතිද ? උන්වහන්සේ ඔබ තුළ සහ ඔබ තුලින් උන්වහන්සේට කැමති දේ ඉටු කිරීමට ඔබ කැමතිද ? සැමිසන්ගේ අතේ තිබූ කොටලුවෙකුගේ හකු ඇටය මෙන් ස්වාමීන්වහන්සේගේ අතේ පාවිච්චිවීමට ඔබ කැමතිද ? එසේ නම් උන්වහන්සේගේ යහපත්කමේ සහ ඇදිහිල්ලේ ක්‍රියාවෙහි යහපත් සතුට ඔබ තුළ ඉටු කිරීමට උන්වහන්සේ පටන්ග
න්නා අතර ඔබට ඔබේ ජීවිතයේ

5 පිටුවට

4 පිටුවෙන්

ආශිර්වාදලත් ජීවිතයේ...

ඉහළ තත්ත්වය මෙසේ ලිවිය හැකිය. "මගේ ජීවිතය නැමති මෙම නිවස යේසුස් වහන්සේගේ අත්වලට මාරුවී ඇති අතර සම්පූර්ණයෙන්ම නව කළමනාකරණයක් යටතේ විවෘත වනු ඇත. සර්වබලධාරී ගැලවුම්කරුවාණෝ ඔබ තුළ ජීවත්වීමට පැමිණියහොත් ඔබට බලයෙන් පිරී සිටීම වළක්වාගත නොහැකිය. ඔබට බලය ජය ගැනීමට අවශ්‍ය නම්, ජයග්‍රාහකයාට පැමිණ ඔබව පිරවීමට ඉඩදෙන්න. එවිට එය සිදුවේ. ඒ පිළිබඳව කථා කිරීම නොව නමුත් ඒ උන්වහන්සේය. එය බලපෑමක් නොව නමුත් ඒ උන්වහන්සේමය.

දයාවන්ත වූ ස්වාමීනී, මෙය මාගේ කැමැත්තයි. මේ මොහොතේ සිට ඔබට වඩාත්ම පිළිගත හැකි සහ වඩාත්ම ආදරණීය දේට සෑමවිටම ආශා කිරීමට සහ ඔබගේ කැමැත්ත කිරීමට ඉඩදෙන්න. ඔබගේ කැමැත්ත මාගේ කැමැත්ත වේවා. මාගේ කැමැත්ත සෑමවිටම ඔබවහන්සේව අනුගමනය කර එයට සම්පූර්ණයෙන්ම එකඟ වේවා. චුම්භකයට වානේ මෙන් සහ හිසට අත මෙන් එය ඉටුවේවා.

වඩා වැඩි දෙයක්

නමුත් ඔබ මතක තබාගත යුතු තවත් දෙයක් තිබේ. බයිබලය කියවීම එනජිමට තෙල් පිරවීම හෝ ආහාර මගින් ආබාධිත කෙනෙකුට ශක්තිය ලබාදීම තරම්ම අවශ්‍යවේ. තවද බයිබලය කියවීම යාච්ඤාවේ ආත්මයෙන් පිරී තිබිය යුතුය. ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් ඔබ කරන වැඩ කටයුතු ඔබව ගිල ගැනීමට ඉඩ නොදිය යුතු අතර උන්වහන්සේට තමන් වහන්සේව හෙළිදරව් කර උන්වහන්සේ ගබඩාකර ඇති අධ්‍යාත්මික බලය ඔබට බාරදීමට හැකි වන පරිදි උන්වහන්සේ සමඟ තනිව සිටීමට ඔබට අවශ්‍ය නිහඬකාලය ගත කළ යුතුය.

ඒ නිශ්චල පැය සඳහා නැවුම්ව සිටීමට ආකර්ෂණීය සේවා මාර්ග වලින් ඔබව නිදහස් කර ගැනීම හොඳ දෙයකි. එය ඔබේ සියලු සේවාවන්ට වඩා උන්වහන්සේට වඩාත් ආදරණීය වන අතර එය ඔබට අවශ්‍ය වේ. **"නුඹ සදවසක් වැඩකොට සත්වෙනි දින නිවාඩු ගත යුතුය. හාන කාලයෙත්, ගොයම් කපන කාලයෙත් ඒ දින නිවාඩු ගත යුතුය." (නික්මයාම 34:21)** ක්‍රිස්තුස් වහන්සේ සමඟ දීර්ඝකාලීන සහයෝගීතාවයෙන් පසු පැයක් වැඩ කිරීම, තම ශක්තියෙන් වෙහෙස මහන්සිවී වැඩ කරන පැය 12 කට හොඳ ප්‍රතිවිපකයක් ලාබදෙනු ඇත. ක්‍රිස්තුස් වහන්සේ එහි ගුණාත්මකභාවය ගැන නොව කරන ලද වැඩ ප්‍රමාණය ගැන අඩු සැලකිල්ලක් දක්වයි. වැඩට වඩා සේවකයා ගැන අවධානයෙන් සිටින සේක.

ස්වාමීනී, අස්වැන්න නෙලීමේදී මෙය මතක තබා ගැනීමට මට උපකාර කළ මැනව. ඔබ තුළ මට විවේකය සහ ශක්තිය ලැබෙන පරිදි පැසී තිබෙන කෙත් වලින් පවා ඉවත්වීමට මට උපකාර කළ මැනව. මම ප්‍රමාද වන බවක් පෙනෙන්නේ නම්, මාර්තාට ඇගේ සහෝදරිය වන මරියා තුලින් කලාක් මෙන් ඔබවහන්සේගේ පැත්තට මා කැඳවීමට යම් ප්‍රේමණීය මතක් කිරීමක් එවන්නැයි මම ඔබවහන්සේගෙන් අයැද සිටින්නෙමි.

තවත් එක් ආශිර්වාදලත් රහසක්

තවත් එක් ආශිර්වාදලත් රහසක් තිබේ. ලෝකය දිනා ගැනීමට අපෝස්තුළුවරුන් උනන්දු වූ විට උන්වහන්සේ දින දහයක් බලා සිටීමට ඔවුන්ට සැලැස් වූ සේක. එසේ කලේ විනාශ වෙන ජාතියක ප්‍රකාශනයන් කෙරෙහි උදාසීන වූ නිසා හෝ ඔවුන්ගේ උද්යෝගය අඩු කිරීමට නොවේ. නමුත් ශුද්ධාත්මයාණන් වහන්සේගේ පරමාධිපත්‍යය වන එම බලය ඔවුන්ට නොලැබුණු නිසාය. සමහරවිට ඔබට මෙය නොමැතිවිය හැකිය. මන්ද ඔබ උන්වහන්සේව සැනසිලිදායකයා, ගුරුවරයා, පවිත්‍ර කරන්නා ලෙස පිළිගෙන ඇත. නමුත් සේවය සඳහා බලය ලෙස උන්වහන්සේව තවමත් හිමිකරගෙන නැත.

නමුත් ඔබ කැමති නම්, උන්වහන්සේ ඔබට එම බලය ලබාදෙන සේක. ආත්මයෙන් පිරී සිටින්න. (එපීස 5:18) එය පවිත්‍ර ධනාත්මක ආඥාවකි. ඔබ කළ යුත්තේ උන්වහන්සේට ඉඩ සැලසීම පමණි. එවිට එම පූජණීය සුළඟ සෑම ස්ථානයක් කරා ඇතුල් වන්නේය. ඔබ නොදැනුවත්වම ආත්මික බලයෙන් පිරියනු ඇත. **"උන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේ කර්‍යකොටගෙන නුඹලාගේ අභ්‍යන්තර මනුෂ්‍යයා තුළ නුඹලා බලයෙන් ශක්තිවත් වන පිණිසත් .." (එපීස 3:16)**

මහෝත්තමයාණන්ගේ බලය අපගේ මෘදු හා ඉවසිලිවන්ත ආත්මයන් වසා ගන්නා විට උන්වහන්සේගේ මහිමයට ලැබෙන ප්‍රතිඵල තක්සේරු කරන්නේ කවුද ? මෙය සභාව තුළ මියයමින් තිබෙන අවශ්‍යතාවයකි. ඇගේ සාර්ථකත්වයේ එකම කොන්දේසිය මෙයයි. නමුත් එය ඇයට හිමිවන්නේ යාචඤාවෙන් හා නිරාහාරව සිටීමෙන් පමණි. එය ලබාගන්නා තුරු ඇය කිසිවිටෙකත් විවේක නොගන්නේ නම් දිනපතා උන්වහන්සේගේ දොරටු අසල බලා සිටිමින් එය රිදී මෙන්, සැඟවුණු නිධානයක් මෙන් සොයමින් සිටින්නේ නම්, ඇය පැරණි කාලයේ මෙන් වීර ක්‍රියාකර අරුණාලෝකය මෙන් නැගී එනවා ඇත. **"අර්‍යණාලෝකය මෙන් නැගී එන්නා වූ සඳ මෙන් පැවැත්නා වූ, ඉර මෙන් දිදිලෙන්නා වූ, කොඩිගත් සේනාවක්මෙන් බලසම්පන්න වූ මෑ කවුද ? " (සොලොමොන්ගේ ගීතිකා 6:10)**

ඔබ මේ බලය දිනාගන්නේ නම්, එය නැතිකර නොගැනීමට ප්‍රවේශම් වෙන්න. එක් පාපයක්, එක් නපුරු චේතනාවක්, එක් උඩඟු සිතුවිල්ලක් තුළට ඇතුල්වීමට ඉඩහැරීමෙන් එය අපෙන් ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය සොරාගනු ඇත. අපි ප්‍රවේසම් වෙමු.

"ස්වාමීන්වහන්සේ ඩහු දෙස බල , නුඹේ වේ බලවත්කමින් ගොස් මිදියන්වර්‍යන් අතින් ඊශ්‍රායෙල් ගලවාපන්න. මා නුඹ යැවුවා නොවිදැයි කී සේක." (විනිශ්චයකර්‍යා 6:14) ආදරණීය සහෝදරයා, සහෝදරිය ඒ බලවත් ආත්මය ඔබ කෙරෙහි පැමිණේවා.

ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුළ

"පූර්ව කාලවලද පරම්පරාවලද පටන් සැඟවී තිබී දැන් දෙවියන් වහන්සේගේ ශුද්ධවන්තයන්ට ප්‍රකාශ වුණා වූ එම රහස වන දෙවියන් වහන්සේගේ වචනය සම්පූර්ණ කිරීමට, නුඹලා උදෙසා මට දෙන ලද උන්වහන්සේගේ ගබඩාකාරකමේ හැටියට සභාවේ සේවකයෙක් කරනු ලැබීමි. අන්‍යජාතීන් අතරේ තිබෙන මේ රහසේ තේජස් සම්පත කිමෙක් ද කියා දෙවියන් වහ්නසේ ශුද්ධවන්තයන්ට දන්වන්නට කැමති වූ සේක. ඒවනාහී තේජසේ බලාපොරොත්තුව වන නුඹලා තුළ සිටින ක්‍රිස්තුස් වහන්සේය. (කොලොස්සි 1:25-27)

සුභාරංචිය යනු මහා රහසයි. අභිරහස්වල අභිරහසයි. මෙම අභිරහසෙහි මහිමයේ ධනය මෙහිදී විවෘතව දැකිය හැකිය. ඔබ තුළ ක්‍රිස්තුස් වහන්සේ මහිමයේ බලාපොරොත්තුවයි. සුභාරංචියේ ආශිර්වාදලත් අභිරහසෙහි කේන්ද්‍රය වන්නේ ක්‍රිස්තුස් වහන්සේම පුද්ගලයෙක් ලෙස උන්වහන්සේ තුළ සිටීමයි. අසීමිත දෙවියන් වහන්සේ කවදා හෝ මනුෂ්‍යයාගේ ස්වභාවය තමන් වෙතට ගැනීම කොයිතරම් අපූරු සංකල්පයක් ද ? එවැනි පහතට පැමිණීමක් ගැන සිතීම මනුෂ්‍යයාට කිසිවිටෙකත් සිදු කළ නොහැකිය. දැන් එය සිදුවී ඇති විටදී පවා එය අපගේ ඇදහිල්ලේ මහා අභිරහසකි. දෙවියන් වහන්සේ සහ මිනිසා එක් පුද්ගලයෙකු තුළ සිටීම ස්වර්ගයේ, පොළොවේ සහ නිරයේ ආශ්චර්‍යයයි. දාවිත් සේ හඬනගා ප්‍රකාශ කළේය. ඔබ මනුෂ්‍යයා සිහිකිරීමට ඔහු කවරෙක්ද ? ඔබ මනුෂ්‍යයා පුත්‍රයා සැලකීමට ඔහු කවරෙක්ද ? (ගීතාවලිය 8:4)

ක්‍රිස්තුස් වහන්සේගේ මාංශවත්වීම

මාංශවත්වීම පිළිබඳ පළමු සිතුවිල්ල දෙවියන් වහන්සේගේ සොයාගත නොහැකි තරම් ප්‍රඥාවන්ත මනසෙහි උපත ලැබීය. එම්මානුවෙල් දෙවියන් වහන්සේ අප සමඟ යන අදහස යෝජනා කිරීමට එයට සර්වබලධාරී සර්වඥතාවය අවශ්‍ය විය. ඒ ගැන සිතන්න. මැවුම්කරුවාණෝ ළඳරුවෙක් වූ සේක. බොහෝ කාලයකට පෙර ළදරුවෙකි. සදාකාල ආශිර්වාද ලද්දෙකි. දුකෙන් පෙළෙන සහ දුකට හුරුපුරුදු මනුෂ්‍යයෙක්වීමේ මුල් අදහස විශ්මයජනක සහ දිව්‍යමය වූ සේක. මෙම ස්වභාවයන් දෙක (දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයා) වෙන කවදා හෝ සිදුවී තිබේද ?

සහෝදරයෙනි, සුභාරංචියේ හදවත මෙම සත්‍යයෙන් ස්පන්දනය වේ. මහෝත්තමයාණන්ගේ පුත්‍රයාණන් බෙත්ලෙහෙමේදී උපත ලැබීය. උන්වහන්සේගේ උපතේදී උන්වහන්සේ ධර්මිෂ්ඨ ක්‍රියාවක් කිරීමට හෝ ලේ බිංදුවක් වැගිරීමට පෙර දේවදූතයන් මෙසේ ගායනා කළේය. **"ඉතා**

(චාර්ල්ස් එච්. ස්පර්ජන් විසිනි.) (1834-1892)

උසස්තැන්හිදී දෙවියන් වහන්සේට මහිමය ද, පොළොවෙහි උන්වහන්සේට ප්‍රිය වූ මනුෂ්‍යයන් අතරෙහි සමාදානය ද වේවායි කීවෝය." (ලූක් 2:14) මක්නිසාද ක්‍රිස්තුස් වහන්සේගේ මාංශවත්වීම තුළ මනුෂ්‍යයා සඳහා යහපත් දේ රාශියක් ඇති බව දේවදූතයන් දැන සිටියාහ. ස්වාමීන් වහන්සේම අපගේ මනුෂ්‍ය ස්වභාවය ගත් විට එයින් අදහස් කළේ මනුෂ්‍ය වර්ගයාට සිතාගත නොහැකි ආශිර්වාදයකි. **"මක්නිසාද අපට ළදරුවෙක් උපන්නේය. අපට පුත්‍රයෙක් දෙන ලද්දේය. ආණ්ඩුවද උන්වහන්සේගේ කර්පිට තිබෙන්නේය. උන්වහන්සේගේ නාමය අද්භූතය. මන්ත්‍රීවර්‍යයා, පර්‍යක්‍රමවත් දෙවියන් වහන්සේය. සදාකාල පියාණෝය. සමාදානයේ කුමාර්‍යා යයි කියනු ලබන්නේය." (යෙසා 9:6)** එම දරුවා සහ පුත්‍රයා තුළ අපට ගැලවීම සොයාගත හැකිය. අපගේ ස්වභාවය තුළ එයින් අපට දෙවියන් වහන්සේගේ ප්‍රීතිය හැර අන් කිසිවක් අදහස් නොවේ. නිසැකවම දෙවියන්වහන්සේ සහ මිනිසා අතර එවැනි එකමුතුවක් පැවතීමේ කාරණය සෑම නැවත උත්පාදනය ලැබුවා වූ මනසකම සතුටයි.

අපගේ ස්වාමීන් වහන්සේ 6 පිටුවට

5 පිටුවෙන්

ක්‍රිස්තුස් වහන්සේ ඔබ...

ගැන සිතන විට උන්වහන්සේ අප වෙනුවෙන් භාරගෙන අවසන් කළ මහිමාන්විත කාරණය උන්වහන්සේ පුද්ගලිකත්වය සමඟ අපට සිහිපත්වේ. මනුෂ්‍යයෙක් ලෙස පෙනී සිටි උන්වහන්සේ තමන්වහන්සේවම යටත් කරගෙන මරණය දක්වා එසේය. කුරුසියේ මරණය දක්වා කීකරු වූ සේක. උන්වහන්සේ සේවකයෙකුගේ ස්වරූපයගෙන පාප මාංශයේ ස්වරූපය ගත්සේක. මන්ද අපි අපගේ සේවයෙන් අසමත් වූ අතර තවත් කෙනෙකු අප වෙනුවෙන් ගැළපෙන සේවය නොකළොත් ගැලවීමට නොහැකි විය. සියල්ලේ උරුමක්කාරයා සේවකයෙකු ලෙස අප අතර සිටීමට තමන්වහන්සේවම සූදානම් කරගත් සේක. උන්වහන්සේගේ සේවය කොයිතරම් දුෂ්කර ද ? කොයිතරම් නිහතමානිද ? කොයිතරම් බරද ? සියල්ලන්ම එය පරිහරණය කරනු ලැබිය යුතුය. උන්වහන්සේගේ ජීවිතය දුකෙන් සහ නින්දාවෙන් පිරී තිබුණු සේක. ඉන්පසුව වේදනාවෙන් සහ අවඥා සහගත මරණයකට මුහුණ දුන් සේක. කුරුසිය දක්වා උන්වහන්සේ අපගේ මුළු බරම උසුලාගෙන ගිය අතර උන්වහන්සේගේ පියාණන් වහන්සේගේ ධර්මිෂ්ඨ කෝපය අපට කිසිදා දරාගත නොහැක පරිදි පැවතිය ද කුරුසිය මත උන්වහන්සේ එය දරාගත් සේක.

ක්‍රිස්තුස් වහන්සේ අප වෙනුවෙන් නොකළේ මොනවාද ? උන්වහන්සේ අපගේ පාප මුහුදේ ගැඹුරට හෙළුසේක. අපි සදාකාලිකවම පානය කළ යුතු වූ කුසලානය උන්වහන්සේ ගෙන එය සම්පූර්ණයෙන්ම වියලා දැමූ සේක. උන්වහන්සේ අප වෙනුවෙන් ශාපයක්වී ව්‍යවස්ථාවේ ශාපයෙන් අපව මුදාගෙන ඇත. දැන් උන්වහන්සේ ශාපය අවසන් කර පාපයට අවසානයක් ලබාදී සදාකාලික ධර්මිෂ්ඨකම ගෙනෙවිත්, දිව්‍යමය පූජාවක් බවට පත්වී, පියාණන් වහන්සේගේ සිංහාසනය වෙතට නැගී අප උදෙසා සියල්ල නිවැරදිකර ආරක්ෂා කරනු ලැබූ සේක. එම නිසා අපට උන්වහන්සේව අනුගමනය කිරීමට පුළුවන. උන්වහන්සේ සිටින තැන උන්වහන්සේ සමඟ සිටිය හැකිය. ඔව්, සහෝදරයෙනි, ක්‍රිස්තුස් වහන්සේගේ පුද්ගලභාවය සහ උන්වහන්සේ සියල්ල නිමා කිරීම අපගේ බලාපොරොත්තුවේ කුළුණු වන්නේය. උන්වහන්සේ කර ඇත්තේ කුමක්ද ? උන්වහන්සේ කරන්නේ කුමක්ද ? සහ උන්වහන්සේ කරන්නට යන්නේ කුමක්ද ? කියා මට සිතාගත නොහැකිය.

ක්‍රිස්තුස් වහන්සේගේ මෙහෙය

මාගේ සහෝදරයෙනි, අපගේ ස්වාමීන් වහන්සේගේ සෑම මෙහෙයක්ම සැනසිල්ලේ උල්පතකි. උන්වහන්සේ අනාගතවක්තෘවරයෙක් ද ? උන්වහන්සේ පූජකයෙක්ද ? උන්වහන්සේ ස්වාමිපුරුෂයෙක්ද ? උන්වහන්සේ හිසද ? සෑම ආකාරයකින්ම සහ සෑම තැනකදීම අපි අපගේ ආත්මයේ බර උන්වහන්සේ මත තබමු.

තවද උන්වහන්සේ අපගේ සියල්ලයි.

ඊට අමතරව උන්වහන්සේ අපගේ නියෝජිතයා යන මිහිරි සිතුවිල්ල තිබේ. පුරාණ කාලයේ දී උන්වහන්සේ අපගේ ගිවිසුමේ ප්‍රධානියා බවත්, සදාකාල ගණුදෙනුවලදී අප වෙනුවෙන් පෙනී සිටි බවත් දන්නේ නැද්ද ? පළමු ආදම් තරඟයට නායකත්වය දුන් අතර ඔහු පාපයට වැටුණේය. ඔහු තුළ මුළු මිනිස් සංහතියම වැටුණි. එබැවින් දෙවන ආදම් වන ක්‍රිස්තුස් වහන්සේ සියලු මනුෂ්‍යයන් තමන්වහන්සේ තුළට ගෙන ඔවුන් වෙනුවෙන් සිටින සේක. ගිවිසුම ආරක්ෂාකර තිබෙන සේක. එබැවින් දැන් සෑම දෙයක්ම ස්ථීර වන අතර එහි සෑම ආශීර්වාදයක්ම මුළු මිනිස් සංහතියම නොවරදින ලෙස සුරක්ෂිත කර ඇත. යේසුස් වහන්සේ ඔවුන්ව නියෝජනය කරන නිසාත්. ඔවුන් වෙනුවෙන් දෙවියන් වහන්සේගේ ආශීර්වාදය හිමිකරගෙන ඇති නිසාත් ඇදහිලිවන්තයන් ගිවිසුමේ උරුමය හිමිකර ගත යුතුයි.

කුමක් වුවත් ක්‍රිස්තුස් වහන්සේගේ සෙනඟ උන්වහන්සේ තුළ සිටිය යුතුය. ඔවුන් උන්වහන්සේ තුළ කුරුසියේ ඇණගසනු ලැබුවෝය. උන්වහන්සේ තුළ මරණයට පත්විය. උන්වහන්සේ තුළ තැන්පත් කරන ලදි. උන්වහන්සේ තුළ මළවුන්ගෙන් නැගිට සිටියි. උන්වහන්සේ තුළ ඔවුන් සාදාකාලයටම ජීවත් වෙති. උන්වහන්සේ තුළ ඔවුන් තේජාන්විතව දෙවියන් වහන්සේගේ දකුණු පැත්තේ වාඩිවී සිටිති. **"ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ ස්වර්ගීය වූ ස්ථානවල උන්වහන්සේ සමඟ අප හිඳුවූ සේක."** **(එපීස 2:6)** උන්වහන්සේ තුළ අපව සදාකාලටයම, **"නමන්වහන්සේගේ කැමැත්තේ ප්‍රසන්නකමේ හැටියට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරුණාකොටගෙන පුත්‍රයන්වීමට අප පෙර නියම කළ සේක."** **(එපීස 1:5)** තවද මා කියන්නේ මෙය මුළු සුභාරංචියේම සාරයයි. ක්‍රිස්තුස් වහන්සේව දේශනා කරන තැනැත්තා සුභාරංචිය දේශනා කරයි. ක්‍රිස්තුස් වහන්සේව දේශනා නොකරන තැනැත්තා සුභාරංචිය දේශනා නොකරයි. ක්‍රිස්තුස් වහන්සේ නොමැතිව සුභාරංචියක් තිබීම සූර්යයා නොමැතිව දවසක් තිබීම හා ජලය නොමැතිව ගංගාවක් තිබීම වැනි විය නොහැකි දෙයකි. ක්‍රිස්තුස් වහන්සේ දේවියන් වහන්සේගේ සුභාරංචියේ අභිරහසෙහි ජීවනය, ආත්මය සහ සාරයයි.

ක්‍රිස්තුස් වහන්සේම උන්වහන්සේ වන සේක

ක්‍රිස්තුස් වහන්සේම උන්වහන්සේ බව මම නැවතත් කියමි. වෙන කිසිවෙකු නොවේ. මම තවදුරටත් පවසන්නේ සුභාරංචිය උන්වහන්සේම විය යුතු අතර එය වෙන කිසිවෙකු නොවේ. එය ක්‍රිස්තුස් වහන්සේ දෙන ඕනෑම දෙයකට වඩා උන්වහන්සේම වන සේක. ක්‍රිස්තුස් වහන්සේ අප අවට සිටින සියලුම මිතුරන් හා උපකාරකයින්ට වඩා වෙනස්දැයි මම සිතුවෙමි. මිතුරන් අපට යහපත් දේ ගෙන එයි නමුත් යේසුස් වහන්සේ අපට උන්වහන්සේවම ලබාදෙන සේක. උන්වහන්සේ අපට ප්‍රඥාව, ධර්මිෂ්ඨකම, විශුද්ධකිරීම සහ මිදීම ලබාදෙනවා පමණක් නොව මේ සියලුම දේ අපට දෙවියන් වහන්සේගෙන් සාදන ලද උන්වහන්සේම වන සේක. එබැවින් උන්වහන්සේ නොමැතිව අපට ක්‍රියා කළ නොහැකිය.

අපි ක්‍රිස්තුස් වහන්සේගෙන් පිරියන තරමට, අපට අපගේම ස්වභාවික හිස් බව දැනෙන්නේය. අපි උන්වහන්සේ ගැන වැඩි වැඩියෙන් දන්නා තරමට අපි උන්වහන්සේව දැන ගැනීමට ආශා කරන්නෙමු. පාවුල් වසර ගණනාවක් කිතුණුවෙකුව සිටියදී පිලිප්පිවරුන්ට ලියමින් මෙසේ පැවසුවේය. **"උන්වහන්සේ සහ උන්වහන්සේගේ නැවත නැඟිටීමේ බලයත්, උන්වහන්සේගේ දුක්වල පංගුකාරකමත් දැනගන්නා පිණිසත්ය."** **(පිලිප්පි 3:11)** පාවුල්තුමා තවමත් ක්‍රිස්තුස් වහන්සේව හඳුණන්නේ නැද්ද ? ඔව් සහ නැත මන්ද ඔහු ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය දැන සිටියේය. එය සියලුම දැනුම ඉක්මවා ගිය බව ඔහුට හැඟුණි. **"සියලු ගංගා මුහුදට යති. එහෙත් මුහුද පිරෙන්නේ නැත. ගංගා පිටත්වෙන තැනටම නැවත යති."** **(දේශනාකාරයා 1 : 7)** එක් අතකින් මෙය අපගේ ගෞවරයේ කාරණා නොවේ. තවත් අතික් එය එසේය. මක්නිසාද කරුණාවේ, ප්‍රේමයේ සහ ආශීර්වාදයේ සියලු ධාරා අප තුළට ගලාඑන අතර අපි පිරී සිටින්නෙමු. නමුත් පිරුණු බවින් අපි තවත් බොහෝ දේ අපේක්ෂා කරන්නෙමු. ස්වාමීනී, ඔබවහන්සේගේ දීමනා නොව, ඔබවහන්සේව අපගේ හදවත්වල ආශාවයි.

ඔබ තුළ සිටින ක්‍රිස්තුස් වහන්සේ වන මෙම අභිරහසේ මිහිරිබව

හදවතේ සිටින ක්‍රිස්තුස් වහන්සේ ඇට මිදුළු හා මේදය මෙන් ඉතා අගනේය. ක්‍රිස්තුස් වහන්සේ සිටින ඔරුවට සන්සුන්කම සහ ආරක්ෂාව ගෙන එන සේක. ඔබගේ නිවසේ, ඔබගේ හදවතේ, ඔබ තුළ ක්‍රිස්තුස් වහන්සේ සිටින සේක. මී වදයේ මී පැණි මෙන් මෙම කාරණයේ සාරය එයයි. ඔබ තුළ ක්‍රිස්තුස් වහන්සේ එනම්, පළමුව ඇදහිල්ලෙන් පිළිගත් ක්‍රිස්තුස් වහන්සේ කවදා හෝ මනුෂ්‍යයෙකු තුළට පැමිණීම අපූරු දෙයක් නොවේද ? ඔව්, එය අපූරු දෙයකි. නමුත් මම ඔබට තවත් අපූරු දෙයක් කියන්නෙමි. එනම් කුඩා ඇදහිල්ල තරම් පටු විවරයකින් උන්වහන්සේට ඇතුල්විය හැකිය. සූර්යයා පෘථිවියට වඩා කොපමණ දහස්වාරයක් විශාල දැයි මම නොදනිමි. නමුත් සූර්යයාට කුඩා කාමරයකට හෝ වසා තිබෙන කුටියකට ඇතුල් විය හැකි අතර ඊටත් වඩා සූර්යයාට හිඩැසක් හරහා ඇතුල්විය හැකිය. දොරගුළු වසා තිබියදී එහි කුඩා සිදුරක් හරහා සූර්යයා ඇතුල්වෙන බව මම දැන සිටියෙමි. එමෙන්ම ක්‍රිස්තුස් වහන්සේට කුඩා ඇදහිල්ලක් හරහා ඇතුල් විය හැකිය. ඔබ දිළිඳු වූ ඇදහිලිවන්තයෙකු නම්, ඔබට සහතිකයක් හෝ විශ්වාසයක් ගැන සිතිය නොහැකි තරම් වුවත් ඔබ ස්වාමීන්වහන්සේව විශ්වාස කරන්නේ නම් සූර්යයා පටු ඉරි තැලීමකින් පවා ඇතුල්වන්නාක් මෙන් සැබෑ ඇදහිල්ලේ කුඩාම විවරයකින් ක්‍රිස්තුස් වහන්සේ ඔබේ ආත්මයට පැමිණෙනු ඇත. ඔබේ ස්වාමීන් වහන්සේගේ මුහුණ කවුළුව අතරින් බැබළෙන ආකාරය ඔබ දකින විට මම මේ කුඩා දිලිසීම් සහ කුඩා දීප්තියෙන් සෑහීමට පත්නොවෙමි. මම සතුටින් උන්වහන්සේගේ මුහුණේ ආලෝකයේ ගමන් කරමි. අඳුරුභාවය සම්පූර්ණයෙන්ම ඉවත් කරන්න. ස්වර්ගීය සූර්යයාට බැබලීමට ඉඩහරින්න. එහි තේජසින් ප්‍රීතිවීමට මට ඉඩදෙන්න. ඇදිහිල්ලෙන් වර්ධනයවීමට ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන ඔබ ක්‍රිස්තුස් වහන්සේ ඔබගේ ආත්මයේ අභ්‍යන්තරයට පැමිනෙණ තෙක් ඔබේ පිළිගැනීමේ බලය පුළුල් කරන්න. මන්ද ඔබ තුළ සිටින ක්‍රිස්තුස් වහන්සේ මහිමයේ බලාපොරොත්තුව බවට පත්වේ.

එහි අදහස ක්‍රිස්තුස් වහන්සේගේ සියලු බලය තුළ උන්වහන්සේව අත්දැක ඇති බවයි. මනුෂ්‍යයෙකුගේ වේදනාවන් දුරු කිරීමට සහ ඔහුගේ රෝග සුව කිරීමට ක්‍රියා කරන වටිනා ඖෂධයක් තිබිය හැකිය. නමුත් එය ඔහු තුලට ඇතුල්වන තෙක් ගුණයක් නොලැබේ. එය ඔහුගේ රුධිරය පවිත්‍ර කිරීමට සහ ඔහුගේ ශරීරය ශක්තිමත් කිරීමට පටන් ගත්විට අනිත් අයගේ සාක්ෂි මත රඳා නොසිට එය දැන ගැනීමට ඔහුට සාධාරණ ක්‍රමයක් ඇතිවේ. ඔබ තුළට ක්‍රිස්තුස් වහන්සේව ලබාගන්න. ඔබේ පාපය සුවකරගන්න. ඔබ තුළ ක්‍රිස්තුස් වහන්සේ ඔබේ ආත්මය ගුණධර්මයෙන්, ශුද්ධකමෙන් හා ප්‍රේමයෙන් පුරවන සේක. ඔබගේ හදවත සැනසිල්ලේ ගිල්වන්න. එය ස්වර්ගීය අභිලාෂයන්ගෙන් දල්වන්න. එවිට ඔබ ස්වාමීන්වහන්සේව හිමිකර ගැනීම, ක්‍රිස්තුස් වහන්සේව ඔබ තුළ අත්දැකීම මේවා ලෝකයක් වටින්නේය.

එපමණක් නොව අප තුළ ක්‍රිස්තුස් වහන්සේ සිටීම යනු **"ක්‍රිස්තුස් වහන්සේ රජකම් කිරීමයි."** ඔබ තුළ සිටින ක්‍රිස්තුස් වහන්සේ යනු නිවැරදි රාජකීය වචනයකි. ක්‍රිස්තුස් වහන්සේ ඔබගේ පැවැත්මේ කේන්ද්‍රයේ සිට සෑම බලයක්, හැකියාවක්, ආශාවක් සහ අධිෂ්ඨානයෙක් මත ආධිපත්‍ය ක්‍රියාත්මක කිරීමෙන් සෑම සිතුවිල්ලක්ම තමන්වහන්සේ වෙතට ගෙන ඒමෙන් මෙය ආරම්භ වූ මහිමය හා ස්වර්ගීය ස්ථීර පොරොන්දුවයි. යේසුස් වහන්සේගේ අධිරාජ්‍යයේ පරමාධිපත්‍ය ගැන වැඩි විස්තර සඳහා උන්වහන්සේගේ පාලනය යටතේ සිටම අපගේ නිදහසයි.

7 පිටුවට

6 පිටුවෙන්

ක්‍රිස්තුස් වහන්සේ ඔබ...

එම නිසා ඔබ තුළ සිටින ක්‍රිස්තුස් වහන්සේ ඔබව පූර්ණකරන ක්‍රිස්තුස් වහන්සේ වන සේක. ක්‍රිස්තුස් වහන්සේ වරක් ඔබගේ ආත්මයට ඇතුලු වූ විට උන්වහන්සේ එය අල්ලා ගන්නා ආකාරය අපූරුව තිබේ. වල්පැළෑටි පමණක් හට ගන්නා උද්‍යානයක සිටි මිනිසෙකුගේ පුරාවෘත්තය ගැන ඔබ කවදා හෝ අසා තිබෙනවාද ? අවසානයේ දී ඔහුට අද්විතීය ජීව ශක්තියක් ඇති අමුතු විදේශීය මලක් හමු විය. කථාව නම්, ඔහු තමා යටතේ පැවති වල් බිහිවෙන උයනේ මේ බීජ ස්වල්පයක් වපුරා තමන්ගේම මිහිරි ආකාරයෙන් වැඩ කිරීමට ඉඩ හැරියේය. ඔහු නිදාගෙන නැගිට්ට අතර මෙම බීජය වැඩෙන ආකාරය දැන සිටියේ නැත. එක් දිනක් උයනේ ගේට්ටුව විවෘත කරද්දී වැපිරූ බීජයෙන් තමන්ව මවිතයට පත්කරන මලක් උපදින බව දැන සිටි අතර එය දකින තුරු සොයමින් සිටියේය. නමුත් ශාකය මුළු උයනම ආවරණය කරනු ඇතියි සිහිනෙන්වත් නොසිතුවේය. සිදු වී තිබුණේ කුමක්ද ? අළුතින් හටගෙන තිබුණා වූ මල උයනේ සෑම වැල්පැළෑටියක්ම විනාශ කර තිබුණි. ඔහු එක් කෙළවරක සිට අනිත් කෙළවර දක්වා බැලූ විට ඔහුට එම දුර්ලභ ශාකයේ වර්ණය හැර අන් කිසිවක් පෙණුනේ නැත. එහි අනර්ඝ සුවඳ හැර අන් කිසිවක සුවඳ දැණුනේ නැත. ක්‍රිස්තුස් වහන්සේ එම කීර්තිමත් ශාකයයි. උන්වහන්සේව ඔබේ ආත්මය නැමති පසෙහි වැපුරුවොත් උන්වහන්සේ ක්‍රමයෙන් සියලු නරක වල්පැළෑටි සහ විෂ සහිත ශාකවල මුල් විනාශ කර දමනු ඇත. එවිට ඔබේ සියලු ස්වභාවයන් පුරා ක්‍රිස්තුස් වහන්සේ සිටිනු ඇත. දෙවියන් වහන්සේ අපට අපගේම හදවත් තුළ ඇති පින්තූරය අවබෝධ කර ගැනීමට ඉඩදෙනු ඇත.

ක්‍රිස්තුස් වහන්සේම මාංශවත්වී මනුෂ්‍යයෙක් ලෙස පැමිණි ආකාරය ඔබ තුළ ඉටුවන තුරු උන්වහන්සේ ඔබ තුළ සිට ඔබව වෙනස් කරන බව එකතු කිරීම අමුතු දෙයක් ලෙස පෙනෙන්නට පුළුවන. ඔබ සීතල කළු යකඩ දණ්ඩක් ගින්නට විසිකර ගින්න එහි ඇතුල්වන තුරු එහි තබා බලන්න. යකඩය ගින්නක් මෙන්ය. එය දෙස බලන තැනැත්තාට ගින්න සහ යකඩය අතර කිසිදු වෙනසක් නොපෙනේ. ගින්න යකඩය විනිවිද ගොස් එය ගිනිමය ස්කන්දයක් බවට පත්කර ඇත. මෝසෙස් තම පාවහන් ගලවා දැමූ හොරෙබ්හී එම පඳුර දැකීමට මම කැමැත්තෙමි. මුළු පඳුරම දැල්වුණු විට එය තවදුරටත් පඳුරක් නොව ගිණි ජාලාවක් සහ පිරිසිදු දැල්ලකින් යුතු උදුනක් මෙන් පෙණුනි. ගින්න පඳුර වෙනස්කර තිබුණි. ක්‍රිස්තුස් වහන්සේ අප තුළට ඇතුල්වන විට අපටත් එසේම සිදුවේ. උන්වහන්සේ අපව උතුම් තත්ත්වයකට ඔසවා තබන බව පාවුල්තුමා පැවසුවේය. **"මම ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි. එසේවී නමුත් මම ජීවත්වෙමි. නුමුත් නවත් මා නොව ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත්වන සේක. නවද මා දැන් මාංශයෙහි ජීවත්වන ජීවිතය මට ප්‍රේම කළා වූ මා උදෙසා තමන්ව පාවා දුන්නා වූ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලනේ ජීවත්වෙමි."** (ගලාති 2:20) යේසුස් වහන්සේ අපව සම්පූර්ණයෙන්ම ආත්මයෙන්, ප්‍රාණයෙන්, ශරීරයෙන් විශුද්ධ කරන අතර උන්වහන්සේ සමඟ ඉහළ පරිපූර්ණ තත්ත්වයේ වාසය කිරීමට අපව රැගෙන යන සේක.

ඔබ තුළ සිටින ක්‍රිස්තුස් වහන්සේ යන ප්‍රකාශය මට පැහැදිලි කළ හැකිවන්නේ කෙසේද ? අපව කුඩා අත්තක් මෙන් බද්ධකර ඇත්තෙමු. නමුත් උන්වහන්සේ ශක්තිමත් හා ජීවමානකදයි. අපව උන්වහන්සේට භාරදී, උන්වහන්සේට බැඳී, උන්වහන්සේට මුද්‍රා තබා ඇත. නව අංකුර සහ පැරණි ගස අතර කිසිවක් නොමැති විට අවසානයේ දී යුෂ බද්ධකල අතුවලට ගලායන අතර බද්ධ කළ අතු සහ ගස එකකි. ක්‍රිස්තුස් වහන්සේ අප තුළට ඇතුල් වී අපගේ ජීවිතය බවට පත්වන ආකාරය ඔබ හොඳින් දැන සිටින්නෝය.

ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුළ, එය මොනතරම් ප්‍රීතියක්ද ? මනමාලයා අප සමඟ සිටින අතර අපට නිරාහාරව සිටිය නොහැකිය. රජතුමා අප සමඟ සිටින බැවින් අපි සතුටු වෙමු. එංගලන්තයේ චාල්ස් රජු නිව් මාර්කට් හි පදිංචියට ගිය පසු දරිද්‍රතාවයෙන් පෙළුණු ගම්මානයක් වූ එය ධනවත් ස්ථානයක් බවට පත්වූවා යැයි කියනු ලැබේ. සැබවින්ම ක්‍රිස්තුස් වහන්සේ අපගේ හදවත් තුළ වාසය කිරීමට පැමිණෙන විට අපගේ ආත්මික දරිද්‍රතාවය හදිස්සියේම ආශිර්වාදලත් වස්තුවක් බවට පත්වේ.

උන්වහන්සේ තේජාන්විත පැමිණීම සාදරයෙන් පිළිගනිමු

ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුළ, උන්වහන්සේ අපගේ ජීවිතය නැමති නිවසේ වහලය යටට පැමිණීමට ඉදිරිපත්වීම මොනතරම් පුදුමයක් ද ? **"ද්වාරයෙනි, තොපගේ හිස් ඔසවව්. එසේය, සදාකාලික ද්වාරයෙනි, හිස් ඔසවව්. තේජසේ bජ්ජුරුවෝ ඇතුල්වන සේක. වේ තේජසේ bජ්ජුරුවෝ කවුද ? සේනාවල ස්වාමීන්වහන්සේය. තේජසේ bජ්ජුරුවෝ උන්වහන්සේය."** (ගීතාවලිය 24:9-10) උන්වහන්සේ අප තුලට පැමිණීමත් සමඟ ගෙන එන ගෞරවය බලන්න. උන්වහන්සේගේ දෙපා මොහොතකට හෝ රැඳී ඇති ස්ථානය උන්වහන්සේ මහිමයට පත්කරන සේක. උන්වහන්සේ ඔබගේ හදවතට පැමිණියහොත්, උන්වහන්සේගේ තීන්දු, උන්වහන්සේගේ ගෞරවය , මහිමය, අමරණීයභාවය, ස්වර්ගීය සහ අනෙකුත් සියලුම දිව්‍යමය කාරණා උන්වහන්සේ ගෙන එනු ලබන සේක.

අනේ, උන්වහන්සේ පැමිණ මා තුළ වාසය කරනවා නම් මම කැමැත්තෙමි කියා යම් කෙනෙක් කියනවා නම් නිහතමානි වෙන්න. මක්නිසාද උන්වහන්සේ යටහත් හා පසුතැවිලි වෙන්නා වූ ආත්මයක් ඇති තැනැත්තන් සමඟ වාසය කිරීමට ප්‍රියකරන සේක. (ගීතාවලිය 51:17) ඊළඟට පිරිසිදු වෙන්න. මන්ද දෙවියන් වහන්සේගේ භාජන උසුලන අය පිරිසිදු විය යුතු නම්, ක්‍රිස්තුස් වහන්සේම ඔවුන් තුළ වාසය කරන අය ඊටත් වඩා පිරිසිදු විය යුතුය. ඊළඟට හිස්වෙන්න. මන්ද ක්‍රිස්තුස් වහන්සේ ආත්මාර්ථකාමීත්වය, උඩඟුකම, ලෞකිකත්වය මධ්‍යයේ වාසය නොකරන සේක. ක්‍රිස්තුස් වහන්සේ තුළ බහුල ලෙස ප්‍රීතිවීමට ඉගෙනගන්න. මන්ද ක්‍රිස්තුස් වහන්සේව ජීවිතයට පිළිගනු ලබන තැනැත්තාට උන්වහන්සේ සෑමවිටම ආගන්තුකයෙකු ලෙස ලැබෙනු ඇත. යේසුස් වහන්සේ කිසිවිටෙකත් තමන්වහන්සේට කැමති නැති තැන රැඳී සිටින්නේ නැත. උන්වහන්සේව පිළිනොගන්නේ නම්, උන්වහන්සේව පිළිගනු ලබන පිණිස උන්වහන්සේ කෙරෙහි ආශාවෙන්, ප්‍රීතියෙන්, පිපාසිතව සිටින අය වෙතට උන්වහන්සේ යන සේක. මක්නිසාද ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ආශාවෙන්, පිපාසයෙන් සහ උන්වහන්සේව අගේකරන සෙනඟක් සමඟ වාසය කිරීමට උන්වහන්සේ සතුටු වන අතර, උන්වහන්සේ නොමැතිව සතුටින් සිටිය නොහැකිය.

"ඔබ තුළ ක්‍රිස්තුස් වහන්සේ" යන දේශනාවෙන් සාරාංශ කරන ලදි.

හුවමාරු වූ ජීවිතය

(ජේ. හඩ්සන් ටේලර් විසිනි.) (1832-1905)

ජේ. හඩ්සන් ටේලර් චීන අභ්‍යන්තර මිෂනාරි සේවයේ නිර්මාතෘවරයා විය. මෙම ලිපිය 1869 දී බ්‍රිතාන්‍යයේ සිටින ඔහුගේ සහෝදරියට ලියන ලද ලිපියකින් සකස් කරන ලදි.

පසුගිය මාසය හෝ ඊට ටිකක් වැඩි කාලය මගේ ජීවිතයේ වඩාත්ම සතුටුදායක කාලයයි. සමහර විට මම ටිකක් ආපස්සට ගියත් මම මාව වඩාත් පැහැදිලි කරගත්තෙමි. පසුගිය මාස හයක් හෝ අටක් තිස්සේ මගේ මනස බොහෝ සෙයින් ව්‍යායාමකර ඇති අතර අපගේ ආත්මයන් තුළ බලය. ජීවනය බොහෝ සෙයින් ශුද්ධකම, අපගේ සේවය සඳහා සහ අපගේ පුද්ගලික අවශ්‍යතාවයන් සඳහා අවශ්‍යව තිබෙන බව දැනෙන්නේය. නමුත් පුද්ගලික අවශ්‍යතාවයන් පළමුව පැවති අතර එය ඉතා මහත්ව තිබුණි. දෙවියන් වහන්සේට සමීපව ජීවත් නොවීමේ අනතුර, පාපය, කෘතඥතාවය නොදැක්වීම මට දැනෙන්නට විය. මම යාච්ඤා කළෙමි. වේදනා වින්දෙමි. නිරාහාරව සිටියෙමි. පොර බැදුවෙමි. තීරණ ගත්තෙමි. බොහෝ සෙයින් උද්‍යෝගිමත්ව දේව වචනය කියෙව්වෙමි. නිශ්චලව ගත කිරීමට සහ මෙනෙහි කිරීමට වැඩි කාලයක් සෙව්වෙමි. නමුත් සියල්ල ඵලරහිත විය.

සෑම දවසකම. සෑම පැයකම, පාපයේ දැනීම (හැඟීම) මා පීඩාවට පත් කළේය. මට ක්‍රිස්තුස් වහන්සේ තුළ රැඳී සිටීමට හැකි නම් සියල්ල හොඳින් සිදුවන බව මම දැන සිටියෙමි. නමුත් මට එය කළ නොහැකි විය. මම දවස ආරම්භ කළේ උන්වහන්සේගෙන් මොහොතකටවත් මගේ දෑස් අහකට නොගැනීමට අධිෂ්ඨාන කරගෙන යාච්ඤාවෙන් යුතුව වුවත් වගකීම්වල පීඩනය, සමහර විට ඉතා වෙහෙසකර තත්ත්වයට පත්වීම්, නිරන්තර බාධාකිරීම් නිසා මට උන්වහන්සේව අමතක විය. එවිට මෙම දේශගුණය තුළ (චීනයේ) කෙනෙකුගේ ස්නායුවල කම්පනය කොයිතරම් නොරුස්සන සුළු ස්වභාවයට පත්වෙනවාද කියනවා නම් කෝපය, දැඩි සිතුවිලි, සමහර විට අකාරුණික වචන භාවිතා කිරීමට පෙළඹීම පාලනය කර ගැනීමට අපහසුය. සෑම දවසකම පාපයේ , අසාර්ථකකමේ, බෙලහීනකමේ ලේඛනයක් (කාරණා රාශියක්) ගෙනාවේය. දෙවියන් වහන්සේව සතුටු කිරීම මා සමඟ තිබුණා නමුත් එය ඉටුකරන්නේ කෙසේදැයි මට හමුනොවීය.

ඊළඟට ගැලවීමක් නැද්ද ? කියා ප්‍රශ්නයක් ආවේය. අවසානය දක්වාම ඒක එහෙම වෙන්න ඕනෙද ? නිරන්තර ගැටුම් සහ ජයග්‍රහණය වෙනුවට බොහෝ විට පරාජයද ? **"නුමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද, එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගන්නෝද, ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන් සේක."** (යොහාන් 1:12) මගේම අත්දැකීම එසේ නොවූ විට මම අවංකව දේශනා කරන්නේ කෙසේද ?

ශක්තිමත්ව වර්ධනය වෙනවා වෙනුවට මම දුර්වල වෙමින් පාපයට එරෙහිව ශක්තිය අඩුවෙමින් පවතින බව පෙනෙන්නට තිබීම පුදුමයක්

8 පිටුවට

Reg. No: DOP/MAGAZINE/28/2026
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

7 පිටුවෙන්

හුවමාරු වූ ජීවිතය...

නොවේ. මක්නිසාද ඇදහිල්ල සහ බලාපොරොත්තුව පවා ඉතා පහත වැටෙමින් තිබුණි. මම මට වෛර කළමේ. මම මගේ පාපයට වෛර කළෙමි. නුමුත් මට එයට එරෙහිවීමට ශක්තියක් ලැබුණේ නැත. මම දෙවියන් වහන්සේගේ දරුවෙක් බව මට හැඟුණි. සියල්ල තිබියදීත් උන්වහන්සේ ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන මගේ ආත්මය තුළ අබ්බා පියාණෙනි කියා මොරගසනු ලැබීය. (රෝම 8:15-16) නුමුත් දරුවෙකු ලෙස මගේ වරප්‍රසාද මත නැගී සිටීමට මට සම්පූර්ණ බලය නැතුව සිටියෙමි.

බලය නොමැතිවීම කණගාටුදායකය

ඒ දීර්ඝ මාසවල අත්දැකීම මෙය බව මම ඔබට හැඟීමක් ඇති නොකරමි. එය ඉතා නිතර නිතර සිදු වූ මාගේ ආත්මයේ තත්ත්වයයි. මම ඒ දෙසට නැඹුරුවෙමින් සිටි අතර එය බලාපොරොත්තු සුන්වීමෙන් අවසන් විය. එහෙත් එවැනි පව්කාරයෙකු ගලවාගැනීමට, මුදා ගැනීමට හැකි ගැලවුම්කරුවාණන් ලෙස ක්‍රිස්තුස් වහන්සේව මෙතරම් වටිනා ලෙස පෙණුනේ නැත. සමහර අවස්ථාවලදී සාමයේ පමණක් නොව ස්වාමීන්වහන්සේ තුළ ප්‍රීතියේ කාලපරිච්ඡේදයන් ද තිබුණි. නමුත් ඒවා තාවකාලික වූ අතර ඕනෑම මොහොතේ දී බලය නොමැතිකමේ දුක්ඛිත තත්ත්වය පැවතුණි. මෙම ගැටුම අවසන් කිරීමට ස්වාමීන්වහන්සේ කොයිතරම් යහපත්ද? මට අවශ්‍ය සියල්ල ක්‍රිස්තුස් වහන්සේ තුළ ඇති බව මට සහතික විය. නමුත් ප්‍රයෝගික ප්‍රශ්නය වූයේ බලය නොමැති තත්ත්වය ඉවත්කරගන්නේ කෙසේද යන්නයි.

උන්වහන්සේ සැබවින්ම බලවත්ව (මාව ගැලවීමට පොහොසත්ව) සිටින බව සැබෑවුවත් මම දිළිඳුව සිටිමි. උන්වහන්සේ ශක්තිමත් නමුත් මම දුර්වලව සිටිමි. මිදිවැලේ මුල්වල සහ කඳේ ශක්තිය බහුලව තිබෙන බව දැන සිටියෙමි. නමුත් එය මගේ ජීවිතය නැමති කුඩා අත්තට ලැබෙන්නේ කෙසේද යන ප්‍රශ්නය තිබුණි. ක්‍රමයෙන් ආලෝකය මා කෙරෙහි උදාවන විට ඇදහිල්ල එකම පූර්ව අවශ්‍යතාවය බවත්, උන්වහන්සේගේ පූර්ණත්වය අල්ලාගෙන එය මගේම කර ගැනීමට දැත් යොමු කළ යුතු බවත් මම දුටුවෙමි. නමුත් මට ඇදහිල්ල නොතිබුණි. මම ඒ සඳහා වෙහෙසුනෙමි. නමුත් එය නොපැමිණියේය. එය ක්‍රියාත්මක කිරීමට උත්සාහ කළ නමුත් නිශ්ඵල විය.

ක්‍රිස්තුස් වහන්සේ සමඟ අපගේ ඒකත්වය

මගේ ආත්ම වේදනාව එහි උච්චතම අවස්ථාවට පැමිණි විට ආදරණීය මැකාතිගේ ලිපියක වාක්‍යයක් මගේ ඇස්වලින් කොරපොතු ඉවත් කිරීමට භාවිතා කරන ලදි. එමෙන්ම දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ යේසුස් වහන්සේ සමඟ අපගේ එක්සත්කමේ සත්‍යය හෙළිදරව් කළේ මා මීට පෙර කිසිදා නොදැන සිටි ආකාරයටය. අසාර්ථකත්වයේ එකම හැඟීමෙන් බොහෝ සේ කටයුතු කර ඇති නමුත් මා දැකීමට පෙර ආලෝකය දුටු **"මැකාති"** මෙසේ ලිවීය. **"ඇදහිල්ල ශක්තිමත් කරගන්නේ කෙසේද ? ඇදහිල්ල පසුපස හඹායාමට වහසිවීමෙන් නොව නමුත් විශ්වාස තැනන්වහන්සේ මත රැඳී සිටීමෙනි. "**

මම එය කියවන විට මට ඒ සියල්ල පෙනෙන්නට පටන්ගත්තේය. **"අප අවිශ්වාසවුනත් උන්වහන්සේ විශ්වාසව සිටින සේක. මක්නිසාද තමන්වහන්සේගේ වචනය බොරු කරන්ට උන්වහන්සේට බැරිය." (2 තිමෝති 2:13)** මම යේසුස් වහන්සේ දෙස බැලූ විට ප්‍රීතිය ගලා ආවේ කෙසේදැයි මම දුටුවෙමි. ... **"මක්නිසාද මව කිසිසේත් නුඹෙන් අහක්ව නොයවි. කිසි අන්දමකින්වත් නුඹ අත්නාරිවියි උන්වහන්සේව කියා තිබේ."** (හෙබ්‍රෙව් 13:5) උන්වහන්සේම එය පැවසූ බැවින් මට උන්වහන්සේ තුළ රැඳී සිටීමට පුළුවන් බව මම සිතුවෙමි. උන්වහන්සේ තුළ රැඳී සිටීමට මම නිශ්ඵල ලෙස උත්සාහ කර ඇත්නම් මම තවදුරටත් එසේ නොකරමි. මක්නිසාද උන්වහන්සේ මා සමඟ නතරවී සිටීමට, කිසිදා මා අතහැර නොයන බවට, කිසිදා මා අසමත් නොකරන බවට පොරොන්දුවී නැද්ද ? තවද උන්වහන්සේ කිසිදා මා අත්හැර නොයන සේක.

උන්වහන්සේ මට පෙන්වූයේ මෙය පමණක් නොවේ. මිදිවැල සහ අතුගැන මා සිතන විට ශුද්ධාත්මයාණන් වහන්සේ මගේ ආත්මයට කෙළින්ම හඟවා දුන්නේ කුමක්ද ? යේසුස් වහන්සේගෙන් මිදියුෂ, එහි පූර්ණත්වය ලබා ගැනීමට මම කැමතිවීම අඩුපාඩුවක් බවයි. මක්නිසාද යේසුස් වහන්සේ කිසිවිටෙකත් මා හැර නොයන බව පමණක් නොව, මම උන්වහන්සේගේ ශරීරයේ, උන්වහන්සේගේ මාංශයේ, උන්වහන්සේගේ ඇටවල, සාමාජිකයෙක් බව පෙන්වා දුන්සේක. (එපීස 5:30)

දැන් මා දකින මිදිවැල මුල පමණක් නොව ඊට මුල, කඳ, අතු, කොළ, මල් සහ ඵල යන සියල්ල අයත් බව දුටුවෙමි. එමෙන්ම යේසුස් වහන්සේ එය පමණක් නොව මිදිවැලට අවශ්‍ය පස, හිරුඑළිය, වාතය සහ වැස්ස වන අතර අපි කවදා හෝ සිහිනමැවූ ප්‍රාර්ථනා කළ හෝ අපට අවශ්‍ය වූවාට වඩා දසදහස් ගුණයකින් වැඩිය. (යොහාන් 15:1 සිට කියවන්න.) මෙම සත්‍යතාවය දැකීමේ ප්‍රීතියෙන් ඔබේ දෑස් ආලෝක වේවායි මම යාච්ඤා කරන්නෙමි. **"එසේ කරන්නේ මහිමයේ පියාණන් වන අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දෙවියන් වහන්සේ, උන්වහන්සේ ගැන දැන ගැනීමට ප්‍රඥාවේද , එළිදරව් කිරීවේද, ආත්මයක් නුඹලාට දෙන ලෙසත්, උන්වහන්සේගේ කැඳවීමේ බලාපොරොත්තුව කිමෙක් ද කියාත්, ශුද්ධවන්තයන් තුළ වූ උන්වහන්සේගේ උරුමයේ සම්පත කිමෙක්ද කියාත්, අදහන්නා වූ අප කෙරෙහි උන්වහන්සේගේ බලයේ මහත්කම කිමෙක්ද කියාත්, නුඹලා දැනගන්න පිණිස නුඹලාගේ සිත් නැවති ඇස් පහදන ලෙසත්ය."** (එපීස 1:17-19)

මළවුන්ගෙන් නැගිටුණාවූ සහ උසස් කරනු ලැබුවා වූ ගැලවුම්කරුවාණන් සමඟ සැබවින්ම ඒකත්වයට පැමිණීම අපූරු කාරණයකි. ක්‍රිස්තුස් වහන්සේගේ සාමාජිකයෙකුවීමට ඇතුලත්වීමෙන් සිදුවන්නේ කුමක්දැයි සිතා බලන්න. ක්‍රිස්තුස් වහන්සේ පොහොසත් නම් මම දිළිඳු විය හැකිද ? ඔබේ දකුණු අත පොහොසත්වී වම් අත දිළිඳු විය හැකිද ? නැතහොත් ඔබගේ ශරීරය කුසගින්නේ සිටියදී ඔබගේ හිස හොඳින් පෝෂණය විය හැකිද ?

අපි ක්‍රිස්තුස් වහන්සේගේ ගෞරවයේ සීමාව තුළ සිටිමින් ඔබගේ හෝ මාගේ යාච්ඤාවන් යේසුස් වහන්සේගේ නාමයෙන් ඔප්පු කළහොත් එය තවදුරටත් අපකීර්තියට පත් කළ නොහැකිය. එය දරා සිටිය හැකි පුළුල් සීමාවකි. ශුද්ධ ලියවිල්ලට පටහැනි හෝ දෙවියන් වහන්සේගේ කැමැත්තට එකඟ නොවන දෙයක් ඉල්ලුවොත් ක්‍රිස්තුස් වහන්සේට පවා එය ඉටු කළ නොහැකිවේ. නුමුත්, **"උන්වහන්සේ ඉදිරියේ අපට තිබෙන නිසැකකම වනි, අපි උන්වහන්සේගේ කැමැත්ත ලෙස යමක් ඉල්ලුවොත් උන්වහන්සේ අපේ ඉල්ලීම අසන බවය. අප යවි දෙයක් ඉල්ලන කළ උන්වහ්සේ අසන බව අපි දනිවු නවි, අප උන්වහන්සේගෙන් ඉල්ලූ දේ අපට ලැබෙන බව දනිවුව."** (1 යොහාන් 5:14-15)

ක්‍රිස්තුස් වහන්සේ සමඟ සම්පූර්ණ හඳුනාගැනීම

එක් කොටසක් තවත් කොටසකට වඩා මිහිරි බව කෙනෙකුට කිව හැකි නම්, වඩාත්ම මිහිරි කොටස වන්නේ ක්‍රිස්තුස් වහන්සේව සම්පූර්ණ හඳුනාගැනීම සමඟ ගෙන එන විවේකයයි. මම මෙය වටහාගන්නා පරිදි මම තවදුරටත් කිසිවක් ගැන කණස්සල්ලට පත්නොවෙමි. මක්නිසාද උන්වහන්සේට උන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමට හැකි බව දනිමි. උන්වහන්සේගේ කැමැත්ත මාගේය. උන්වහන්සේ මාව කොතැනක තැබූවත්, කෙසේ තැබූවත් එය වැදගත් නොවේ. එය මා කෙරෙහි සැලකීමට වඩා උන්වහන්සේ කෙරෙහි සැලකීමට වන්නේය. මක්නිසාද පහසු ස්ථානවලදී උන්වහන්සේගේ කරුණාව මට ලබාදෙන අතර වඩා දුෂ්කර ස්ථානවලදී උන්වහන්සේගේ කරුණාව සෑහෙන්නේය. තමාගේ සේවකයාට මුදල් දී වටිනා දේවල් කිහිපයක් රැගෙන ඒමට යවනවාද, නැතහොත් වඩාත්ම අධික ලිපියක් රැගෙන ඒමට යවනවාද යන්න එතරම් වැදගත් නොවේ. කෙසේ වෙතත් උන්වහන්සේ මා දෙස බලා උන්වහන්සේ වෙනුවෙන් මිලදී ගැනීමට මට භාරදෙන සේක. එබැවින් දෙවියන් වහන්සේ මාව මහත් ව්‍යාකුලත්වයක් ඇති ස්ථානයක තැබුවොත් උන්වහන්සේ මට බොහෝ මඟපෙන්වීමක් ලබාදිය යුතු නොවේද ? මහත් දුෂ්කර ස්ථානවලදී බොහෝ කරුණාවත්, මහත් පීඩනයක් සහ පරීක්ෂාවක් ඇති ස්ථානවලදී බොහෝ ශක්තියක් ලබාදෙන සේක. බොහෝ ශක්තියක් හදිස්සි අවස්ථාවලදී උන්වහන්සේගේ සම්පත් අසාමාන්‍යය ලෙස ලබාදීමත් සිදුවන නිසා බියක් නැත.

උන්වහන්සේගේ සම්පත් මාගේය. මක්නිසාද උන්වහන්සේ මාගේය..

උන්වහන්සේ මා සමඟ සිටින අතර මා තුළ වාසය කරන සේක. මේ සියල්ල පැමිණෙන්නේ ඇදිහිලිවන්තයා ක්‍රිස්තුස් වහන්සේ සමඟ ඇති ඒකත්වය තුළවන අතර ඇදහිල්ලෙන් ක්‍රිස්තුස් වහන්සේ මාගේ හදවතේ වාසය කරන බැවින් මම කොයිරම් සතුටුවන්නෙමිද ?

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැගී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශීර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම වේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:

පෙරමග දූතයා

30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.